# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,988 - 2016 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2016.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1746 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |



*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2016 ජුනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2016.05.03 වැනි දින සම්මත කරන ලදුව 2016.08.29 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

පද්මිණී කාරියවසම්,
සභා ලේකම්,
වයඹ පළාත් සභාව.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කුරුණෑගල වයඹ පළාත් සභාවේ
සභා ලේකම් කාර්යාලයේ දී ය.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය**

වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

දීර්ඝ නාමය.

ජාතික මහා මාර්ග හා ජාතික මහා මාර්ගවල ඇති පාලම් සහ තොටුපොළවල් හැර වයඹ පළාත තුළ ඇති මාර්ග, පාරවල්, පාලම් සහ තොටුපළවල් හා නිර්මිතයන් සැලසුම් කිරීම, ඉදිකිරීම, සංවර්ධනය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම, නඩත්තු කිරීම, සීමා මායිම් නිර්ණය කිරීම හා ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 01 දරන ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය සංශෝධිත පනත්වලින් සංශෝධිත, 1861 අංක 10 දරන මංමාවත් ආඥාපනත හා 1988 අංක 05 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත හා 2009 අංක 37 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතින් සංශෝධිත, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතට ද අදාළ වන පරිදි අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154උ(1) ව්‍යවස්ථාව මගින් පළාත් සභාව වෙත පවරා ඇති බලතල ප්‍රකාරව එහි 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 6 වැනි වගන්තියේ විධිවිධාන පරිදි, වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රඥප්තියේ අරමුණු.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

*(අ)* සීමිත සම්පත්, දියුණු තාක්ෂණය හා ශිල්පීය නිපුනතාවය ඵලදායී ලෙස කළමනාකරණය කරගනිමින් වයඹ පළාත් මාර්ග පද්ධතිය කාර්යක්ෂමව ප්‍රවාහන මෙහෙයුම් සඳහා නිර්මාණය කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

*(ආ)* ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ මහා මාර්ග පද්ධතිය සහ පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන සතු මාර්ග සහ අනෙකුත් ග්‍රාමීය මාර්ග හා බැඳී පවත්නා නවීකරණය වූ පළාත් සහා මාර්ග පද්ධතියක් ස්ථාපනය කිරීම.

*(ඇ)* උපදේශක ගාස්තු හා මුල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ පදනම මත මාර්ග සංවර්ධනය හා නඩත්තු කිරීම පිළිබඳව පළාතේ පිහිටි පළාත් පාලන ආයතනවලට හා වෙනත් ආයතනවලට අවශ්‍ය උපදෙස් හා සේවා සැපයීම.

*(ඈ)* වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම.

(ඉ) වයඹ පළාත් මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලය පිහිටුවීම.

(ඊ) වයඹ පළාත් මාර්ග වන්දි කමිටුව පිහිටුවීම.

I වැනි කොටස

**පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම, එහි සංයුතිය, බලතල හා කාර්යභාරය**

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා "වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව" යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කළ යුත්තේ ය. මෙම දෙපාර්තමේන්තුව අමාත්‍යවරයාගේ හා ලේකම්වරයාගේ සාමාන්‍ය සහ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවලට යටත්ව වයඹ පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යාංශය යටතේ ස්ථාපනය වන්නේ ය. දෙපාර්තමේන්තුව පිහිටුවීම.

4. මෙම දෙපාර්තමේන්තුව අවිච්ජින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් වයඹ පළාත් සහා මාර්ගවලට අදාළ සියළු කටයුතු ඉටුකිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති නීතිගත ආයතනයක් වන්නේ ය. දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

5. මෙම දෙපාර්තමේන්තුව පළාත් අධ්‍යක්ෂවරයෙකුගෙන් ද, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, විධායක ඉංජිනේරුවරුන්, මූලස්ථාන ඉංජිනේරුවරුන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් ද සමන්විත වන්නේ ය. දෙපාර්තමේන්තු-වේ සංයුතිය.

6. වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා "වයඹ පළාත් මාර්ග අධ්‍යක්ෂ" යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමු පංතියේ නිලධාරියෙකු විෂය භාර අමාත්‍යවරයා විමසා පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේ ය. අධ්‍යක්ෂවරයා පත් කිරීම.

7. මෙම ප්‍රඥප්තියේ අංක 5 වගන්තිය යටතේ දක්වා ඇති නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා සියලුම ඉංජිනේරුවරුන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් විය යුතු වන්නේ ය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා ඉංජිනේරුවරුන්.

8. දෙපාර්තමේන්තුව සඳහා පත් කරනු ලබන සියලුම නිලධාරීන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය. පළාත් අධ්‍යක්ෂවරයාගේ නියෝග අනුව කටයුතු කරන ඕනෑම නිලධාරියෙකු හෝ නිලධාරිණියක විසින් තම නිල තත්ත්වයෙහිලා මීට අදාළව කරන ලද හෝ නොකරන ලද හෝ කිසිවක් සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට විරුද්ධව තම පුද්ගල නාමය යටතේ කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුත්තේ ය. දෙපාර්තමේන්තු නිලධාරීන් රජයේ සේවකයින් බව.

9. වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ :- දෙපාර්තමේන්තු-වේ කාර්යභාරය.

(1) මෙම ප්‍රඥප්තියේ III වන කොටසේ සඳහන් වයඹ පළාත් සභාවට අයත් "C" හා "D" පංතියේ මාර්ග හා ඒවායේ ඇති පාලම්, තොටුපළවල් හා නිර්මිතයන්, සැලසුම් කිරීම, ඉදිකිරීම, සංවර්ධනය කිරීම, ඉදිකිරීම් හා සංවර්ධනය කිරීම් අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ උපදේශක සේවා සැපයීම.

(2) ඉහත 9(1) උපවගන්තියෙහි සඳහන් පළාත් මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, නඩත්තු කිරීම සඳහා අවස්ථානුකූලව සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, නඩත්තු අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ උපදේශක සේවා සැපයීම.

(3) පළාත් මාර්ග පද්ධතියේ මාර්ග සහ මාර්ග රක්ෂිත සීමා මායිම් නිර්ණය කිරීම හා ආරක්ෂා කිරීම.

(4) පළාත් මාර්ග පද්ධතියට හෝ මාර්ග සහ මාර්ග රක්ෂිතයට හානි පමුණුවන්නන්ට විරුද්ධව මෙම ප්‍රඥප්තියේ නියමකර ඇති පරිදි, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

(5) පළාත් මාර්ග පද්ධතියට ගංවතුර වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන හානි ප්‍රතිසංස්කරණය කිරීම හෝ ඉදිකිරීමක් හෝ සංවර්ධනය කිරීමක් සඳහා පළාත් සභාව හෝ වෙනත් ආයතනයක් මගින් ලබාදෙන මුල්‍ය ප්‍රතිපාදන උපයෝගී කොටගෙන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(6) දෙපාර්තමේන්තු විෂය පථයට අයත් තොරතුරු පද්ධතිය වාර්ෂිකව සකස් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(7) පළාත් සභා මාර්ගයක් හෝ මාර්ග, පළාත් සභා නොවන ප්‍රතිපාදන හෝ වෙනත් විශේෂ ව්‍යාපෘති මගින් පුනරුත්ථාපනය කිරීමට හෝ වැඩිදියුණු කිරීමට හෝ ඉන් අනතුරුව නඩත්තුව පවත්වාගෙන යාමට අදහස් කරන්නා වූ යම්කිසි ආයතනයකට, සංවිධානයකට හෝ කණ්ඩායමකට උපදේශක මණ්ඩලයේ කොන්දේසි සහිත අනුමැතිය මත අවසර ලබාදීම.

අමාත්‍යවරයා සතු බලතල.

10. (1) අමාත්‍යවරයා විසින් රජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වන කොටසේ (පළාත් සභා) පළකරනු ලබන නියමයක් මගින් 12 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ උපදේශක මණ්ඩලය විමසා, පළාත තුළ පිහිටි යම් මාර්ගයක් මෙම ප්‍රඥප්තිය යටතේ ගැනෙන මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ය.

එසේ වුවද පළාත් සභාවට අයත් මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති I වන උපලේඛනයේ දැක්වෙන මාර්ග, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසුව, මෙම වගන්තියේ අර්ථානුකූලව පළාත් සභා මාර්ග ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තියේ II වන කොටසේ සඳහන් උපදේශක මණ්ඩලය විසින් මාර්ග තලයේ අවම පළල මීටර් 3.7 ක් හා දෙපසින් මාර්ග උරහිස හා කාණු සඳහා අවශ්‍ය අවම ඉඩ මීටර් 1.5 බැගින් ඇති මාර්ගයේ සම්පූර්ණ පළල මීටර් 6.7 කට නොඅඩු වූ සහ මාර්ගයේ පාලම්, බෝක්කු හා අනෙකුත් නිර්මිත හොඳ තත්ත්වයෙන් ඇත්තා වූ,

*(අ)* යම් මාර්ගයක් හෝ වැඩි ගණනක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් හරහා ගමන් කරන බවට සහ ප්‍රධාන මංසන්ධි දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරන බවට හා එම මාර්ගය, ජාතික මාර්ගයක් සම්බන්ධ කරන මාර්ගයක් බවට ; හෝ

*(ආ)* යම් මාර්ගයක් දිනකට වාහන සියයකුත් දෙසිය පනහකුත් අතර ප්‍රමාණයක් ධාවනය වන හා පළාත් මාර්ග දෙකකට සම්බන්ධ වන බවට ; හෝ

*(ඇ)* යම් මාර්ගයක් අනෙකුත් ජාතික හෝ පළාත් මාර්ගවලට සම්බන්ධවීම සලස්වන ප්‍රධාන ගංගා හරහා යා හැකි සුවිශේෂ වැදගත්කමකින් යුතු පාලම් ඇති බවට ; හෝ

*(ඈ)* ඒ මාර්ග පළාතේ අතිවිශේෂ වැදගත්කමක් ඇති ස්ථානයකට හෝ පළාතේ විශේෂ යෝජනා ක්‍රමයකට ප්‍රවේශය සලසන බවට ; හෝ

සෑහීමකට පත්වන්නේ නම්, දැනට එම මාර්ගය අයත් ආයතනයේ එකඟතාවය මත ඒ මාර්ගය හෝ මාර්ග, අමාත්‍යවරයා විසින් පළාත් සභාවට පවරාගනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) හා (2) උප වගන්ති යටතේ ප්‍රකාශයට පත්කරන ලද මාර්ග සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමේ අයිතිය පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

අධ්‍යක්ෂවරයා සතු බලතල.

11 (1) ලේකම්වරයා ගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව මෙම ප්‍රඥප්තියේ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා හෝ පනවනු ලබන නියෝග හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේ ය.

(2) අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, මූලස්ථාන ඉංජිනේරුවරුන්, විධායක ඉංජිනේරුවරුන් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම පිළිබඳ වගකියනු ලැබිය යුතු ය. විධායක ඉංජිනේරුවරයෙකුගේ බලතල අදාළ විධායක ඉංජිනේරු කොට්ඨාසයට සීමා වන අතර, විධායක ඉංජිනේරු කොට්ඨාසවල සීමා, පළාත් අධ්‍යක්ෂවරයා විසින් වරින් වර ප්‍රකාශයට පත්කළ හැකි ය.

(3) පළාත් අධ්‍යක්ෂවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් අවස්ථාවෝචිත පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුට, මූලස්ථාන ඉංජිනේරුවරයෙකුට, විධායක ඉංජිනේරුවරයෙකුට හෝ යම් නිලධරයෙකුට හෝ මෙම ප්‍රඥප්තියේ සඳහන් කර්තව්‍ය

ඉටු කිරීමට යොදා ගන්නා යම් තැනැත්තෙකුට, ආයතනයකට හෝ සංවිධානයකට පවරා දෙනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

## II වන කොටස

### පළාත් මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලය පිහිටුවීම හා එහි කාර්යභාරය

12. වයඹ පළාත තුළ පිහිටි මාර්ග සම්බන්ධයෙන් අදාළ වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, මාර්ග සම්බන්ධයෙන් පළාතට ගැළපෙන නිර්ණායකයන් සකස් කිරීම හා පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම සඳහා මෙහි මින්මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන "පළාත් මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලයක්" පිහිටුවනු ලැබිය යුතු ය. පළාත් මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලය පිහිටුවීම.

13. (1) උපදේශක මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :- උපදේශක මණ්ඩලයේ සංයුතිය හා සාමාජිකයන් පත් කිරීම.

*(අ)* වයඹ පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යවරයා.

*(ආ)* වයඹ පළාත් සභාවේ විපක්ෂනායකවරයා සහ පළාත් මාර්ග විෂය භාර අමාත්‍යාංශ උපදේශක කමිටුව විසින් නම්කරනු ලබන පළාත් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙක්.

*(ඇ)* වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙකු.

*(ඈ)* කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ ඔවුන් විසින් නම්කරනු ලබන එක් නියෝජිතයෙකු බැගින්.

*(ඉ)* වයඹ පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා.

*(ඊ)* වයඹ පළාත් සභාවේ මුල්‍ය කටයුතු පවරා ඇති නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙකු.

*(උ)* වයඹ පළාත් සභාවේ ඉංජිනේරු කටයුතු පවරා ඇති නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙකු.

*(ඌ)* වයඹ පළාත් සභාවේ සැලසුම් කටයුතු පවරා ඇති නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙකු.

*(එ)* වයඹ පළාත් සභාවේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා.

*(ඒ)* මාර්ග සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් භාර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙකු.

*(ඔ)* කුරුණෑගල හා පුත්තලම නියෝජ්‍ය පොලිස්පතිවරුන් හෝ ඔවුන් විසින් නම්කරනු ලබන එක් නියෝජිතයෙකු බැගින්.

*(ඕ)* වයඹ පළාත් පාලන කොමසාරිස්වරයා.

*(ක)* තීරණයක් ගැනීමේ දී අවස්ථානුකූලව සම්බන්ධ කරගත යුතුයැයි පළාත් අධ්‍යක්ෂවරයා විසින් උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිර්දේශ කරන නිලධරයන් හෝ තැනැත්තන්.

(2) ඉහත (1) උප වගන්තියේ (අ) සහ (ඇ) සිට (ඕ) දක්වා අනු වගන්තිවල සඳහන් සාමාජිකයින් නිල බලයෙන් පත්වන අතර, (ක) අනු වගන්තිය යටතේ දක්වා ඇති සාමාජිකයින් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ හැක්කේ ය.

(3) වයඹ පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යවරයා උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා උපදේශක මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය.

(4) සභාපතිවරයා උපදේශක මණ්ඩලයේ මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා නොමැති අවස්ථාවක ඉහත (1) (ආ) අනු වගන්තියෙහි සඳහන් මන්ත්‍රීවරුන් අතරෙන් බහුතර කැමැත්තෙන් පත් කරගන්නා මන්ත්‍රීවරයා සභාපති ධුරයේ කාර්යයන් ඉටුකළ යුතු වේ.

උපදේශක මණ්ඩලයේ කාර්යභාරය.

14. උපදේශක මණ්ඩලයේ කාර්යභාරය පහත සඳහන් වේ.

*(අ)* ස්වකීය මණ්ඩලය වෙත යොමු කරනු ලබන වයඹ පළාත තුළ පිහිටි මාර්ග සංවර්ධනය, නවීකරණය හා කාලීන වශයෙන් මතුවන ගැටළු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

*(ආ)* මාර්ගය භාවිතා කරන්නන්ට පහසුකම් සැලසීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සඳහා පළාතට යෝග්‍ය නිර්ණායකයන් තීරණය කිරීම.

*(ඇ)* මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග සංවර්ධන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

*(ඈ)* ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ මහා මාර්ග පද්ධතිය හා බැඳී පවත්නා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභාව ඇතුළත පිහිටි මාර්ග පද්ධතියට අයත් මාර්ග, රජයට හෝ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත හෝ පවරාදීම සම්බන්ධයෙන් තීරණ ගැනීම.

*(ඉ)* පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන විසින් නඩත්තු කරනු ලබන යම් මාර්ගයක් හෝ විශේෂ ව්‍යාපෘතියක් යටතේ වැඩිදියුණු කරන ලද මාර්ගයක් හෝ මාර්ග මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කිරීමට හා සංවර්ධනය කිරීමට අදාළ පවරා ගැනීම් සම්බන්ධයෙන් තීරණ ගැනීම.

සාමාජිකයන්ගේ ධුර කාලය.

15. අමාත්‍යවරයා විසින් පත් කරන සාමාජිකයින්ගේ ධුර කාලය වසර දෙකක් වන්නේ ය.

සාමාජිකත්වය අහෝසි වීම.

16. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධුර කාලය සම්පූර්ණවීම, ධුරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කිරීම, අනුගාමී රැස්වීම් වාර දෙකකට සහභාගි නොවීම හෝ සාමාජිකයෙකුගේ මරණය හෝ සිහි විකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන අතර, එම පුරප්පාඩුව අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වන්නේ ය.

උපදේශක මණ්ඩලයේ රැස්වීම්.

17. උපදේශක මණ්ඩලය යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් බැගින් රැස්විය යුතු වන්නේ ය. අවශ්‍ය වන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

ගණපූරණය.

18. උපදේශක මණ්ඩලයේ ගණපූරණය සාමාජිකයින්ගෙන් තුනෙන් එකක් විය යුතු ය. සාමාජිකයින්ගේ පුරප්පාඩු පැවතීම, කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීමට හෝ බාධාවක් නොවන්නේ ය.

රැස්වීම් දීමනා.

19. මෙම මණ්ඩලයේ සාමාජිකයින්ට හා ලේකම්වරයාට ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය මත ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන සහභාගීත්ව දීමනාවක් ගෙවිය හැකි වන්නේ ය.

## III වන කොටස

### පළාත් සභා මාර්ග

පළාත් සභා මාර්ග.

20. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 10 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන මාර්ග ද, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විටත් පළාත් සභා මාර්ග සේ සලකා ක්‍රියා කරන ලද 1 වන උපලේඛනයේ දැක්වෙන " C " සහ " D " යනුවෙන් හඳුන්වනු ලැබූ වයඹ පළාත තුළ පිහිටි මාර්ග ද වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවිය යුතු ය.

(2) විශේෂිත වර්ගීකරණයක් ඇත්තා වූ ;

*(අ)* "C" ශ්‍රේණියේ මාර්ග යන්නට, ජාතික මහා මාර්ගයකින් ආරම්භ වී ජාතික මහා මාර්ගයකින් හෝ පළාත් සභා මාර්ගයකින් අවසන් වන මාර්ග ද,

*(ආ)* "D" ශේණියේ මාර්ග යන්නට, ජාතික මහා මාර්ගයකින් ආරම්භ වී ජාතික මහා මාර්ගයක් නොවන හෝ පළාත් සභා මාර්ගයක් නොවන මාර්ගයකින් හෝ ස්ථානයකින් අවසන් වන මාර්ග සහ පළාත් සභා මාර්ගයකින් ආරම්භ වී ජාතික මහා මාර්ගයකින් අවසන් නොවන මාර්ග ද,

ඇතුළත් වේ.

(3) 1 වන උපලේඛනයේ දැක්වෙන මාර්ග වයඹ පළාත් සභා මාර්ග ලෙස සලකනු ලබන අතර, පළාත් සභාව වෙත අළුතින් පවරා ගන්නා හෝ වෙනත් ආයතනයක් වෙත පවරා දෙන මාර්ග පිළිබඳ විස්තර අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය ඇතිව රජයේ *ගැසට් පත්‍රයේ* IV වන කොටසේ (පළාත් සභා) පළකරන ලද *ගැසට් නිවේදනයක්* මගින් පමණක් පවරා ගැනීම හෝ පවරා දීම සිදුකළ යුතු ය.

21. (1) මෙම ප්‍රඥප්තියේ 20(3) උපවගන්තිය යටතේ කෙරෙන නිවේදනයේ කරුණක් ලෙස හෝ *ගැසට් පත්‍රයේ* IV වන කොටසේ (පළාත් සභා) පළකරනු ලබන නියමයන් මගින් හෝ අමාත්‍යවරයා විසින් පළාත් සභා මාර්ගයක් හෝ ඒවායේ කොටසක් ඔස්සේ ඉදිකිරීම් සීමාවන් හෝ රක්ෂිත සීමාවන් නිෂ්චිතව දක්වනු ලැබිය යුතු ය. ඉදිකිරීම් සීමාවන් හා මාර්ග රක්ෂිත සීමාවන්.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ පළාත් සභා මාර්ග දෙපස ඉදිකිරීම් සීමාවන් නිෂ්චිතව දක්වා නොමැති අවස්ථාවක එම මාර්ගයේ ඉදිකිරීම් සීමාවන් ලෙස ;

*(අ)* "C" ශ්‍රේණියේ මාර්ගයේ රථ වාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් දහයක් ද,

*(ආ)* "D" ශ්‍රේණියේ මාර්ගයේ රථ වාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් දහයක් ද,

*(ඇ)* ඊට අමතරව දැනටමත් පළාත් මාර්ග දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතයන් ද,

ඇතුළත් විය යුතු ය.

(3) යම් පළාත් මාර්ගයක නගර ආශ්‍රිතව හෝ මංසන්ධි වැනි ස්ථානවල රක්ෂිත සීමාවන් හා ඉදිකිරීම් සීමාවන් වෙනස් කිරීම අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, අමාත්‍යවරයා විසින් එම සීමාවන් කලින් කල *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු ය.

## IV වන කොටස

### මාර්ග ඉදිකිරීම් හා ඉඩම් අත්පත්කර ගැනීම්

22. (1) විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන ඉල්ලීම් පිළිබඳව පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය අනුව ; අළුත් මාර්ග ඉදිකිරීම, මාර්ග පුළුල් කිරීම, වෙනතකට හැරවීම.

*(අ)* අළුතින් පළාත් සභා මාර්ගයක් ඉදිකිරීම සඳහා, හෝ

*(ආ)* පවත්නා මාර්ගයක් ඉඩම් අත්පත් කරගැනීමක් සහිතව පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා, හෝ

*(ඇ)* යම් මාර්ගයක් වෙනතකට හැරවීම සඳහා, හෝ

අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.

(2) යම් මාර්ගයක් අළුතින් ඉදිකිරීම හෝ පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම හෝ වෙනතකට හැරවීම සඳහා හෝ බලය දෙනු ලබන අවස්ථාවකදී එම මාර්ගයේ රක්ෂිත භූමි ප්‍රදේශය සහ ඉදිකිරීම් සීමාවන්ද මාර්ගයේ දිග පළල නිශ්චිතව දක්වමින් මිණුම් පිඹුරක් පිළියෙළ කිරීමට අමාත්‍යවරයා විසින් පළාත් අධ්‍යක්ෂවරයාට බලය දෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් අනුව අවස්ථාවෝචිත පරිදි ඉහත (2) වන උප වගන්තියේ සඳහන් මිණුම් පිඹුර මගින් පෙන්නුම් කර ඇති ඉඩම් ප්‍රදේශය හෝ එහි යම් බැඳියාවක් පළාත් සහා මාර්ගයක ඉදිකිරීම් සීමා හෝ රක්ෂිත ප්‍රදේශය හෝ ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

මාර්ග රක්ෂිතයක් හෝ ඉදිකිරීම් සීමාවන් ඇතුළත සංවර්ධන වැඩ කටයුතු තහනම් කිරීම.

23. (1) මෙම ප්‍රඥප්තියේ 22(3) උපවගන්තිය යටතේ නියමයන් *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු, එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශයේ සීමා ඇතුළත ගොඩනැගිලි ඉදිකිරීම්, වෙනත් යම් කර්තව්‍යයක් කිරීම, නැවත ඉදිකිරීම් තහනම් විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තියේ 22(3) උපවගන්තිය යටතේ මාර්ග රක්ෂිතයක් හෝ ඉදිකිරීම් සීමාවන් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, පළාත් මාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව මිස, යම් රජයේ ආයතනයක් හෝ පළාත් සභාවේ යම් ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙනයම් ආයතනයක් හෝ තැනැත්තකු විසින් හෝ එසේ රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක් ඇතුළත කිසිම සංවර්ධන ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක වීමට සැලැස්වීම නොකළ යුතු ය.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අදාළ වීම.

24. යම් ඉඩමක් හෝ එම ඉඩමේ යම් සම්බන්ධතාවයක් අවස්ථාවෝචිත පරිදි මාර්ග රක්ෂිතයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක ;

*(අ)* එකී ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ කාර්ය සඳහා මහජන අවශ්‍යතාවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

*(ආ)* එකී ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අත්පත් කරගනු ලැබිය හැකි ය. එහිදී ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ සඳහන් විධිවිධාන හා කාර්ය පටිපාටි අනුගමනය කළ යුතු ය.

පළාත් පාලන ආයතනයක් සතු ඉඩම් අත්පත් කර ගැනීම.

25. (1) පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතනයක් සතු යම් මාර්ග රක්ෂිතයක ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක් මෙම ප්‍රඥප්තියේ කාර්යයක් සඳහා අවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් සහතික කරන අවස්ථාවක දී එකී බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විමසා පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් එකී නියමයේ සඳහන් කර ඇති දිනයක සිට බල පැවැත්වෙන පරිදි සියලු බැඳීම්වලින් නිදහස්ව යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක් සහ එකී නියමයේ සඳහන් කර ඇති එකී ඉඩම මත පිහිටි ගොඩනැගිලි හෝ ඉදිකිරීම්වල පරම අයිතිය පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබිය යුතු ය. එකී ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවයක් හෝ ඒ මත ඉදිකර ඇති ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් වන්දි මුදල් ගෙවනු ලැබිය හැකි ය.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ විශේෂ ප්‍රදාන.

26. (1) මෙම ප්‍රඥප්තියේ 22 වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා රජයේ ඉඩමක් හෝ රජයේ ඉඩමකින් කොටසක් හෝ අවශ්‍ය වන අවස්ථාවක එම කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් ලබාදිය යුතු කාර්යයක් ලෙස සැලකිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී දෙපාර්තමේන්තුව සන්තකයේ පවතින හෝ දෙපාර්තමේන්තුව විසින් පාවිච්චි කරනු ලබන සහ *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියමයක නිශ්චිතව දක්වා ඇති සියලු මාර්ග සහ ඒවායේ ඉදිකිරීම්වල මාර්ග අයිතිය ද ඇතුළුව සියලු වත්කම් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා සතු කරනු ලැබිය යුතු ය.

27. අමාත්‍යවරයාගේ අනුමැතිය මත අදාළ දෙපාර්තමේන්තුව විසින් මිනින්දෝරු සැලැස්මේ දක්වා ඇති ඉඩම් හෝ එහි යම් සම්බන්ධතාවක් වන්දි ගෙවා අත්පත් කරගනු ලැබිය හැකි ය. ඉඩම් අත්පත් කර ගැනීම.

28. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම බලපා ඇති හෝ ක්‍රියාත්මක කිරීම නිසා හෝ අවතැන් වූ තැනැත්තන් නැවත පදිංචි කරවීම සඳහා අවශ්‍ය ඉඩම්, අමාත්‍යවරයාගේ අනුමැතිය මත දෙපාර්තමේන්තුව විසින් මිල දී ගැනීමට හෝ වන්දි ගෙවා අත්පත් කර ගැනීමට හැකි ය. නැවත පදිංචි කරවීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

29. (1) කිසියම් ඉඩමක් හෝ එහි යම් සම්බන්ධතාවක් මිල දී ගැනීම සඳහා හෝ අත්පත් කර ගැනීම සඳහා ද කිසියම් වන්දි මුදලක් ගෙවීමට ද පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත පළාත් මාර්ග වන්දි කමිටුවක් පිහිටුවිය යුතු ය. පළාත් මාර්ග වන්දි කමිටුව.

*(අ)* වන්දි කමිටුවේ සභාපතිවරයා විය යුතු පළාතේ ප්‍රධාන ලේකම්වරයා.

*(ආ)* මාර්ග විෂය භාර පළාත් අමාත්‍යංශයේ ලේකම්වරයා

*(ඇ)* පළාත් සභාවේ මූල්‍ය කටයුතු පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා.

*(ඈ)* වන්දි කමිටුවේ ලේකම් විය යුතු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්වරයා.

*(ඊ)* කමිටුවට අවශ්‍ය උපදෙස් ලබාගැනීම සඳහා පළාත් මාර්ග අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය අනුව ප්‍රධාන ලේකම්වරයා විසින් පත් කරනු ලබන විශේෂ සාමාජිකයෙකු.

(2) කමිටුවේ ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකි.

(3) අදාළ මිල දී ගැනීමේ දී හෝ වන්දි ගෙවීමේ දී සෑමවිටම පළාතේ පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවක් ලබාගත යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන යම් පාඩු හෝ අලාභහානි සම්බන්ධයෙන් වන්දි ගෙවීම පිළිබඳව තීරණ ගැනීම මෙම කමිටුවේ කාර්යයක් විය යුතු ය.

30. (1) මාර්ගයක් නඩත්තු කිරීමේ හෝ මහජන පොදු කාර්යයක් සඳහා හෝ පළාත් අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසිවලට යටත්ව දෙපාර්තමේන්තුව භාරයේ පවතින යම් ඉඩමක් හෝ එහි යම් සම්බන්ධතාවයක් දින 90 කට නොවැඩි කාලයක් සඳහා තාවකාලිකව පාවිච්චි කිරීමට ඉඩදෙනු ලැබිය හැකි ය. තාවකාලිකව ඉඩම් අන්සතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතු බලය.

(2) මහජන පොදු කාර්යයන් සම්බන්ධයෙන් තවදුරටත් කාලය දීර්ඝ කිරීමක් අවශ්‍ය වේ නම් කාලය දීර්ඝ කිරීමට පළාත් අධ්‍යක්ෂවරයාට හැකි ය.

## V වන කොටස

## වැඩ පිළිබඳ විධාන සහ පාලනය

31. මෙම ප්‍රඥප්තිය යටතේ භාරගත යුතු සහ ඉටුකළ යුතු සියලු වැඩ පිළිබඳව විධාන කිරීම සහ පාලනය පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා සතු විය යුතු ය. එකී බලය අවස්ථාවෝචිත පරිදි සෙසු නිලධාරීන්ට පැවරිය හැකි ය. වැඩ පිළිබඳ විධාන සහ පාලනය පළාත් අධ්‍යක්ෂවරයා සතු බව.

32. (1) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත, විධායක ඉංජිනේරුවරයා විසින් පළාත් සභා මාර්ගයක් ; මාර්ගයක් තාවකාලිකව වසා දැමීමේ බලය.

*(අ)* තාවකාලිකව වසා දැමීම හෝ

*(ආ)* පවත්නා කොටසක් වෙනුවට විකල්ප පථයක් හෝ විකල්ප මාර්ග කොටසක් ආදේශ කිරීම.

කරනු ලැබිය හැකි ය.

(2) මෙහිදී අදාළ ආයතන දැනුවත් කිරීම විධායක ඉංජිනේරුවරයා විසින් සිදුකළ යුතු ය.

(3) යම් මාර්ගයක් ස්ථිරවම වසා දැමීමක දී උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු අතර, ප්‍රසිද්ධ දැන්වීමට අමතරව *ගැසට් පත්‍රයේ ද* එකී නිවේදනය පළකළ යුතු ය.

(4) මෙම වගන්තියේ යම් නියමයක් ක්‍රියාත්මක කිරීමේ දී එකී කාර්යය සඳහා ඉඩමක් අත්පත්කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් එකී ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍ය බවට සැලකිය යුතු අතර, ප්‍රඥප්තියේ විධිවිධාන එකී අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මාර්ගයක සේවාවන් පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තු අවසරය ලබාගත යුතු බව.

33. (1) කිසියම් තැනැත්තකු හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් හෝ පළාත් සභාවේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් යම් ආයතනයක් විසින්, අවස්ථාවෝචිත පරිදි පළාත් අධ්‍යක්ෂවරයාගේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හෝ විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව විදුලිය, විදුලි සංදේශ, ජලය, ගෑස් හෝ වෙනත් සේවාවන් සඳහා මාර්ගය හෝ මාර්ග උරහිස් හෝ කානු පද්ධතිය හෝ මාර්ග රක්ෂිතය හෝ පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තියේ සඳහන් යම් සේවාවක් සඳහා මාර්ග රක්ෂිතයක් පාවිච්චි කිරීමට පළාත් අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඉල්ලුම් කරන යම් තැනැත්තෙකුගෙන් හෝ ආයතනයකින් ගාස්තුවක් අය කරනු ලැබිය හැකි ය. අයකරනු ලබන ගාස්තුව විධායක ඉංජිනේරුවරයා විසින් පිළියෙළ කරනු ලබන ඇස්තමේන්තුව මත පදනම් විය යුතු ය.

(3) තත්කාර්ය සඳහා වූ යම් විශේෂ නීතියක විධිවිධානවලට යටත්ව දෙපාර්තමේන්තුව වෙනුවෙන් අවස්ථාවෝචිත පරිදි පළාත් අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් ඉහත 33(1) වන උප වගන්තියේ සඳහන් සේවාවන් හෝ වෙනත් සේවාවන් පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා එම වගන්තියේ සඳහන් කිසියම් ආයතනයක් විසින් යම් මාර්ගයක් හෝ මාර්ග රක්ෂිතයක් පාවිච්චි කිරීම සඳහා බලය දීමට සහ පරිපාලනය කිරීම සඳහා එකී තැනැත්තා හෝ ආයතන හෝ වෙනත් ආයතන සමඟ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

(4) මාර්ගයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම හෝ බෙදීම කරනු ලබන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි පළාත් අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බාධකයක් ලෙස හඳුනාගත් යම් තැනැත්තකු විසින් ඉදිකර ඇති හෝ යොදා ඇති යම් භෞතික ඉදිකිරීමක් හෝ නල මාර්ගයක් හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත එම තැනැත්තාගේ වියදමින් ඉවත්කර ගන්නා ලෙස එම තැනැත්තාට නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(5) යම් විරෝධතාවයක් නිසා හෝ ඉහත (4) වන උපවගන්තියේ සඳහන් බාධකය ඇති කිරීම සඳහා වගකිවයුතු තැනැත්තා සොයාගත නොහැකි වීම නිසා හෝ එකී බාධකය ඉවත්කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයාට නොහැකි හෝ බාධකය ඇති කළ පුද්ගලයා නොමැති අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් තත්කාර්ය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත එකී බාධකය ඉවත්කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(6) එකී ඉල්ලීමේ කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව, මහෙස්ත්‍රාත්වරයා විසින් එකී බාධකය ඉවත් කරන ලෙස පිස්කල්වරයා වෙත නියෝග කරනු ලැබිය හැකි ය.

සේවාවක් සඳහා අවසරයක් නොමැතිව මාර්ගයක් ප්‍රයෝජනයට නොගත යුතු බව.

34. (1) කිසියම් තැනැත්තකු විසින් 33(3) වන උප වගන්තියේ සඳහන් ගිවිසුමක වූ නියමයන් හෝ කොන්දේසි යටතේ හෝ ඒවාට අනුව මිස යම් මහජන සේවාවක් හෝ පෞද්ගලික ව්‍යවසායක කාර්යයක් සඳහා මාර්ගයක් ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ මත යම් දෙයක් ඉදිකිරීම, යන්ත්‍රයක් සවි කිරීම, මාර්ගයේ ධාවනය කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) යම් ගිවිසුමක් ප්‍රකාරව, යම් මාර්ගයක් කැනීම හෝ හෑරීම හෝ කැපීම ආරම්භ කිරීම සඳහා අවසර දීමට පෙර, එකී මාර්ගය කැනීම හෝ හෑරීම හෝ කැපීම නිසා සිදුවන, එම මාර්ගය යථා තත්ත්වයට පත්කිරීම හෝ අළුත්වැඩියාකිරීම සඳහා වැයවන බවට විධායක ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරනු ලබන පිරිවැය සහ පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආපසු ගෙවිය හැකි අමතර තැන්පතුවක් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ය. අදාළ විධායක ඉංජිනේරුවරයා විසින් එකී මුදල් භාවිතාකර එම මාර්ගය කඩිනමින් යථා තත්ත්වයට පත්කළ යුතු ය.

(3) ඇස්තමේන්තු කරන ලද වියදමට වඩා වැඩි වියදමක් දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන්නේ නම්, එකී මුදල ආපසු ගෙවනු ලබන තැන්පතුවෙන් අඩුකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(4) මෙම වගන්තියේ සඳහන් යම් විධිවිධානයක් කඩ කරන හෝ එකඟව කටයුතු කිරීම පැහැර හරින හෝ ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට හානිය යථාවත් කිරීම සඳහා විධායක ඉංජිනේරු විසින් පිළියෙළ කරනු ලබන ඇස්තමේන්තුවේ පිරිවැය අය කර ගැනීමට සහ රුපියල් ලක්ෂය නොඉක්මවන දඩයකට හෝ එක් වසරක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු ය.

35. (1) මෙම ප්‍රඥප්තියේ 33(3) වන උපවගන්තියේ සඳහන් යම් ගිවිසුමක හෝ යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් මාර්ගයක බාධකයක් ඇතිකර ඇති හෝ යම් මාර්ගයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම හෝ බෙදීම සඳහා බාධකයක් ඇතිකර ඇති යම් තැනැත්තෙකු වෙත, නිශ්චිතව දක්වා ඇති කාලයක් ඇතුළත එකී බාධකය ඉවත් කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් දැන්වීමක් නිකුත් කළ හැකි ය. විධායක ඉංජිනේරුවරයා විසින් බාධක ඉවත් කළ හැකි බව.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලත් තැනැත්තා විසින් එකී බාධකය ඉවත් කිරීම හෝ වැළැක්වීම සඳහා හෝ එකී භෞතික ඉදිකිරීම හෝ නල මාර්ගය ඉවත් කිරීමට එහි සඳහන් කාලය ඇතුළත ඉවත් කිරීම පැහැර හරින හෝ අතපසු කරන අවස්ථාවක, විධායක ඉංජිනේරුවරයා විසින් හෝ ඔහු විසින් නීත්‍යානුකූලව බලය පවරන ලද යම් තැනැත්තකු විසින් එකී බාධකය ඉවත් කිරීම හෝ වැළැක්වීම හෝ එම භෞතික ඉදිකිරීම, නල මාර්ගය වෙනත් තැනකට ගෙනයාම සිදුකිරීම ද ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම අයකර ගැනීම ද නීත්‍යානුකූල විය යුතු ය.

(3) ඉහත (1) වන උපවගන්තියෙහි සඳහන් බාධකය ඉවත් කිරීම ඉටු නොකර පැහැර හැර ඇත්නම් එම බාධකය ඇති කළ තැනැත්තා ඒ සම්බන්ධයෙන් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හය නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හා එම බාධකය ඉවත් කිරීමට දරන ලද වියදම අයකර ගැනීමට යටත් විය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි එකී ඉවත් කිරීම හෝ වැළැක්වීම හෝ වෙනත් තැනකට ගෙනයාම හේතුවෙන් යම් ගිවිසුමක් කඩවීම පිළිබඳව එකී තැනැත්තා වෙත කිසිම වන්දි මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

36. (1) පළාත් අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින්, තමාගේ අරමුණ එහි සිටින පදිංචිකරු වෙත දැනුම්දීමෙන් පසුව, අවශ්‍ය වාහන, උපකරණ, ආයුධ සහ වෙනත් අවශ්‍ය දේ සමග යම් පවත්නා හෝ යෝජිත මාර්ගයක යාබද ඉඩමකට හෝ අළුත් මාර්ග රක්ෂිතයක් වශයෙන් අනාගතයේදී ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ඉඩමකට දවසේ ඕනෑම වේලාවක ඇතුළුවිය හැකි අතර ; මාර්ග කැනීම, මිනුම් කටයුතු ආදිය සඳහා බලය දිය හැකි බව.

*(අ)* මැනීම, මිනුම් කටයුතු සලකුණු කිරීම, වැඩ කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අළුත්වැඩියා කිරීම, පිරිසිදු කිරීම, වැඩිදියුණු කිරීම හෝ ඒ මත වැට ඉදිකිරීම ;

*(ආ)* යම් පාලමක්, සපත්තු පාලමක්, පස් රඳවාගැනීමේ ඉදිකිරීමක්, බෝක්කුවක්, කානුවක්, වැටක් හෝ අගලක් ඉදිකිරීම, කැනීම අළුත්වැඩියා කිරීම ;

*(ඇ)* යම් නිලධරයෙකුගේ හෝ ඔහුගේ සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ එවැනි නිලධරයෙකු හෝ ඔහුගේ සේවකයන්ගේ පරිහරණය සඳහා යම් ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම ;

යන කාර්යයන් සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවන් සහ කටයුතු සිදුකළ හැකි ය.

(2) පළාත් අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් තමාගේ අරමුණ ඉඩමේ පදිංචිකරු වෙත දැනුම් දීමෙන් පසුව, දවසේ ඕනෑම වේලාවක ඉහත (1) වන උප වගන්තියේ *(අ)* සිට *(ඇ)* හි සඳහන් කාර්යය සඳහා, යම් පවත්නා හෝ යෝජිත මාර්ගයක යාබද ඉඩමකට ඇතුළු වී, එම පවත්නා හෝ යෝජිත මාර්ගයට යාබද ඉඩමෙන් හෝ ආසන්න ඉඩමෙන්

ජලය, දැව, කැපූ අතු, ගල්, බොරළු, වැලි හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් තිබේදැයි සෝදිසි කිරීම, හැරීම හෝ කැපීම කරනු ලැබිය හැකි ය.

මාර්ගය අසල පිහිටි ඉඩමකට ඇතුළුවීම හා යම් ද්‍රව්‍යයක් ලබාගැනීම හා ඉවත් කිරීම නීත්‍යානුකූල බව.

37. (1) යම් මාර්ගයක හදිසි අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක දී, පළාත් අධ්‍යක්ෂවරයා විසින් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් එකී මාර්ගය අසල පිහිටි ඉඩමක් මතින් තත්කාර්ය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ගෙනයාම හෝ ඉවතට ගෙනයාම නීත්‍යානුකූල විය යුතු ය.

(2) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක් කරන, පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හෝ විසින් බලය දෙන ලද නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එම කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු හෝ අයුතු ලෙස ඉඩමකට ඇතුළු වූ තැනැත්තෙකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පළාත් අධ්‍යක්ෂවරයා විසින් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් හෝ බලය දෙන ලද නිලධරයෙකු, සේවකයෙකු හෝ එම කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින්, යම් ද්‍රව්‍යයක් පහසුවෙන්ම යාබදව පිහිටි ඉඩමකින් ලබාගත හැකි නම්, අයිතිකරුගේ එකඟතාවය මත එකී ද්‍රව්‍ය එම ඉඩමෙන් ලබාගත හැකි ය.

(4) දෙපාර්තමේන්තුව විසින් යම් ඉඩමකින් ද්‍රව්‍යයක් ඉවත්කර ගන්නා වූ අවස්ථාවක ඉඩමේ අයිතිකරුට එසේ ඉවත්කර ගන්නා වූ ද්‍රව්‍ය සඳහා සහ ද්‍රව්‍ය ඉවතට ගෙනයාමේ දී සහ ප්‍රවාහනයේ දී සිදුවන අලාභහානි සඳහා සාධාරණ වන්දියක් ගෙවනු ලැබිය යුතු ය.

(5) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ එම කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින්, එකී ද්‍රව්‍ය ලබාගන්නා වූ සෑම වලක් හෝ ආකරයක්ම වැටවල් ඉදිකිරීම හෝ තාවකාලික ආවරණ බාධක ඇති කිරීම මගින් සුදුසු ආරක්ෂණ පියවර ගත යුතු ය.

මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මත තාවකාලික ගොඩනැගිලි ඉදිකළ හැකි බව.

38. (1) මෙම ප්‍රඥප්තියේ 37 වැනි වගන්තියේ දැක්වෙන යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී ඉඩම් හිමියාට දැනුම් දීමෙන් පසු අදාළ නිලධාරීන් සහ කම්කරුවන්ගේ නවාතැන් සඳහා හෝ යන්ත්‍රෝපකරණ සහ උපකරණ ගබඩාකර තබාගැනීම සඳහා හෝ පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හෝ විසින් බලය පවරන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති තැනැත්තෙකු විසින්, ඊට යාබද යම් ඉඩමක් මත තාවකාලික ගොඩනැගිලි සෑදීම හා ඉදිකිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය සඳහා මුඩු ඉඩමක් හෝ රජයේ ඉඩමක් හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක හෝ ඉඩමක් ආසන්නතම දුරක ඇති අවස්ථාවක, ඉහත (1) වැනි උපවගන්තියේ සඳහන් කාර්යයන් සඳහා පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් හෝ බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින් එකී ඉඩමේ තාවකාලික ගොඩනැගිලි සෑදීම හා ඉදිකිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) එවැනි ඉඩමක් පාවිච්චි කිරීම සඳහා සහ එයට සිදු වූ යම් හානියක් සඳහා එකී ඉඩමේ අයිතිකරුට දෙපාර්තමේන්තුව විසින් සාධාරණ වන්දියක් ගෙවනු ලැබිය හැකි ය.

යාබද ඉඩමකට අපද්‍රව්‍ය හෝ ගල්, බොරළු ආදිය දැමිය හැකි බව.

39. (1) අළුත් මාර්ගයක්, මාර්ග පුළුල් කිරීමක් හෝ සංවර්ධනය කිරීමක්, පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබාගන්නා ව්‍යුහයක් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම හා සම්බන්ධ වැඩක් හෝ යම් පස් කඳු කඩා වැටීමක පස් ඉවතලීම සිදුකිරීම කරගෙන යනු ලබන කාලසීමාවක දී පළාත් අධ්‍යක්ෂවරයා විසින් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති තැනැත්තෙකු විසින් ගල්, බොරලු හෝ ඉවත දමන ද්‍රව්‍ය ඊට ආසන්න යම් ඉඩමකට තාවකාලිකව දැමිය හැකි ය.

(2) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ යම් කාර්යයක් කිරීමේ දී එකී ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුවන් හට ඇති වන්නා වූ අනවශ්‍ය පීඩාවන් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු අතර, තාවකාලිකව දැමූ ද්‍රව්‍ය හැකි ඉක්මනින් ඉවත් කළ යුතු ය.

40. (1) අළුත්වැඩියාකිරීම, නැවත ඉදිකිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබාගන්නා ව්‍යුහයක් වසා තබන ලද කාලය තුළ, පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින් යාබද ඉඩම හරහා රථවාහන ගමනා ගමනය කරවීම සඳහා තාවකාලික පාරක් ඉදිකිරීම කළ හැකි අතර එසේ කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තාවකාලික මාර්ග සෑදිය හැකි බව.

(2) ඉහත (1) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ යම් කාර්යයක් කිරීමේ දී එකී ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුවන්ට ඇති වන්නා වූ අනවශ්‍ය පීඩාවන් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු අතර, තාවකාලිකව ඉදිකළ පාර ඉවත්කර යථාවත්කර දිය යුතු ය.

(3) එබඳු තාවකාලික පාරක් ඉදිකිරීමේ දී, ගොඩනැගිල්ලක් කඩාදැමීම හෝ යම් හොඳින් සැකසුනු උද්‍යානයක් හෝ අංගනයක් අයුතු ලෙස පවරා ගැනීමක් සඳහා නියම කරනු නොලැබිය යුතු ය.

41. යම්කිසි මාර්ගයකට අලාභ සිදුකරන හෝ වාහන ගමනාගමනයට, වීථි ආලෝක කරණයට, දෘෂ්ඨියට, මාර්ග දේපළවලට හෝ මහජනතාවට අනතුරුදායකවන හෝ බාධාකරන සියලු ගස්, පඳුරු, වන ලැහැබ, අතු කොළ, මුල් කපා ඉවත් කිරීම ද, එම ගස් කප්පාදු කිරීම හෝ ඉවත් කිරීම ද පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින් අවශ්‍ය කම්කරුවන්, මෙවලම් හා උපකරණ සමග ඒ සඳහා යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීම ද නීත්‍යානුකූල විය යුතු ය. මාර්ගයක් ඉදිකිරීම පහසු කිරීම සඳහා ගස් කැපීම සහ කප්පාදු කිරීම.

42. පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ එකී කාර්යය පවරා ඇති යම් තැනැත්තෙකු විසින් යම් මාර්ගයක් දිගේ වැටවල්, බාධක, අගල්, වලවල්, කානු හෝ ඉවුරු සෑදීම නීත්‍යානුකූල විය යුතු ය. මාර්ග ඔස්සේ වැටවල් ආදිය ඉදිකිරීම.

43. සියලු අගල්, කානු, බෝක්කු සහ පාලම්, විවර, දියපාර යනාදිය සෑදීමට, පිරිසිදු කිරීමට සහ විවෘතව තැබීමට පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට බලය තිබිය යුතු ය. ඉහත ක්‍රියාවලට බාධා පමුණුවන හෝ අලාභ හානි සිදුකරන ක්‍රියාවන්, එකී යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් සිදුනොකළ යුතු ය. කානු ආදිය විවෘතව තැබිය හැකි බව.

44. (1) මෙම ප්‍රඥප්තිය මඟින් පවරා ඇති බලතල යටතේ යම් ක්‍රියාවක් සිදුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තෙකු වෙත පාඩුවක් හෝ අලාභයක් සිදුකරනු ලබයි නම්, එකී පාඩුව හෝ අලාභය සඳහා වන්දි ලැබීමට එම තැනැත්තාට හිමිකමක් තිබිය යුතු ය. දේපළවලට සිදුවන අලාභ සඳහා වන්දි ගෙවිය යුතු බව.

(2) එබඳු තැනැත්තෙකු විසින් එකී අලාභය සිදුවී මාස 03 ක කාල සීමාවක් ඇතුළත, පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ කරනු ලබන ඉල්ලීම් පළාත් මාර්ග වන්දි කමිටුවට ඉදිරිපත්කිරීමට කටයුතු කළ යුතු ය. තත්කාර්ය සඳහා මෙම කාලසීමාවෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සලකනු නොලැබිය යුතු ය.

## **VI** වන කොටස

### මාර්ග ආරක්ෂා කිරීම

45. (1) පළාත් සභා මාර්ගයකට ආසන්න හෝ යාබද ඉඩමේ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට මාර්ග යේ ආරක්ෂිත බැම්මකට හෝ කානුවකට හෝ මාර්ග රක්ෂිතයට හෝ මාර්ගයට හෝ බාධාවක්, අවහිරතාවයක් හෝ අලාභයක් හෝ කිරීමකින් තොරව මාර්ගයට ප්‍රවේශවීමේ හෝ පිටවීමේ අයිතිය තිබිය යුතු ය : මාර්ගයකට යාබද ඉඩම්වල අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට එම මාර්ගයට ප්‍රවේශවීමේ අයිතිය.

(2) එසේ වුව ද එකී මාර්ගයට ප්‍රවේශවීමේ හෝ පිටවීමේ අයිතිය කවර ආකාරයකින් හෝ බලපවත්නා අයිතිවාසිකමක් හෝ හිමිකම් පෑමක් නොවිය යුතු ය.

46. (1) මෙම ප්‍රඥප්තියේ 21 වැනි වගන්තියේ සඳහන් මාර්ග සීමාවන් ඇතුළත පළාත් අධ්‍යක්ෂවරයාගේ හෝ විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව, කිසිම තැනැත්තකු යම් මාර්ගයක ඉදිකිරීම් සීමාව තුළ ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ යම් තාප්පයක්, වැටක් හෝ ඉදිකිරීමක් කිරීම හෝ එවැනි ගොඩනැගිල්ලක්, තාප්පයක් හෝ වැටක් අලුත්වැඩියා කිරීම හෝ තාවකාලික වැටක් ඉදිකිරීම හෝ ආවරණයක් තැබීම නොකළ යුතු ය. අවසරයකින් තොරව මාර්ග යට අයත් ඉදිකිරීම් සීමාව තුළ ඉදිකිරීම් කළ නොහැකි බව.

(2) ඉහත (1) වන උප වගන්තියේ සඳහන් පූර්ව අනුමැතිය නොමැතිව යම් තැනැත්තකු ක්‍රියාකර ඇති අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් එකී ගොඩනැගිල්ල කඩා දැමීමට සැලැස්වීම හෝ එකී තාප්පය හෝ එකී වැට හෝ ඉදිකිරීම, ආවරණය ගලවා ඉවත් කිරීම සහ එකී තැනැත්තාගෙන් එම ඉවත් කිරීම සඳහා වූ වියදම අයකර ගැනීම ද නීත්‍යානුකූල විය යුතු ය.

(3) එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි එවැනි කඩාදැමීමක් හෝ ගලවා ඉවත් කිරීමක් සිදු කිරීමට පෙර විධායක ඉංජිනේරුවරයා විසින් එහි අයිතිකරුට හෝ පදිංචිකරුට එකී කඩා දැමීම හෝ ඉවත් කිරීම පිළිබඳ ප්‍රමාණවත් පූර්ව දැනුම්දීමක් සිදුකළ යුතු ය.

(4) ඉහත (2) වන උපවගන්තියෙහි සඳහන් ගෙවීම පැහැර හරින ඕනෑම තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකට වරදකරු වූ කල්හි රුපියල් පනස්දහස නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට සහ විධායක ඉංජිනේරුවරයා විසින් ඉහත (2) වන උපවගන්තියෙහි සඳහන් කාරණය සඳහා දරන ලද වියදම ද අයකර ගැනීමට යටත් කළ යුතු වන්නේ ය.

තාවකාලික ආවරණ ඉදිකිරීම සඳහා අවසර ලබාදීම.

47. (1) මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව යම් පුද්ගලයෙකුගේ තාවකාලික පදනම මත වූ සැරසීමක් ඉදිකිරීමේ අයිතිය ද ඇතුළුව, තම නිවස හෝ ගොඩනැගිල්ල කඩා දැමීමේ, අළුත්වැඩියා කිරීමේ ඉදිකිරීමේ කටයුතු කරගෙන යාම සඳහා, ගාස්තු ගෙවීමේ පදනම මත යම් තාවකාලික වැටක් හෝ ආවරණයක් ඉදිකිරීම සඳහා මාර්ගයේ කොටසක් පාවිච්චි කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් අවසර ලබාදීම නීත්‍යානුකූල විය යුතු ය.

*(අ)* එසේ අවසරය ප්‍රදානය කර ඇත්තේ යම් තැනැත්තෙකු හෝ ආයතනයක් වෙත ද, ඒ තැනැත්තා හෝ ආයතනය විසින් එකී තාවකාලික ආවරණය හෝ ඉදිකිරීම පවත්නා තාක් කල් එම පරිශ්‍රය තුළ රාත්‍රී කාලයේ ප්‍රමාණවත් ප්‍රබලතාවය ඇති ආලෝකය සපයා තිබිය යුතු ය.

*(ආ)* එකී මාර්ගයේ රථවාහන සහ පදිකයන්ගේ ගමනාගමනයට අවහිර නොවන ලෙස ප්‍රමාණවත් ඉඩ පහසුකම් සලසා දිය යුතු ය.

(2) 34 වන වගන්තියේ හෝ 35 (1) වන උප වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, හදිසි වූ ද, පූර්ව අනුමැතියක් ලබාගැනීමට කාලයක් නොමැත්තා වූද ප්‍රමාද කිරීම මහජන සුබසිද්ධිය පිණිස හානියක් වන්නා වූද අවස්ථාවක දී මහජන සේවයක් බෙදාහැරීමෙහිලා සම්බන්ධවී සිටින යම් නිලධරයෙකු එකී මාර්ගයේ යම් කොටසක් තාවකාලික ලෙස පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(3) ඉහත (2) වන උප වගන්තිය යටතේ සිදු කරන යම් ක්‍රියාවක් විධායක ඉංජිනේරුවරයාට හෝ පළාත් අධ්‍යක්ෂවරයාට අප්‍රමාදව දැන්වීමට ක්‍රියා කළයුතු අතර, එකී සේවාව ලබාදීමේ දී, මාර්ගයට හෝ මාර්ග රක්ෂිතයට හෝ කානුවකට හෝ මාර්ගයේ යම් කොටසකට හෝ සිදුව ඇති හානිය, යථාවත් කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරන ලද මුදල එකී සේවාව ලබාදීමට ක්‍රියාකරන ලද ආයතනය විසින් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය.

(4) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, මෙම වගන්තියේ සඳහන් පූර්ව අනුමැතිය ලබා ඇත්නම් මිස, යම් ඉදිකිරීමක් සඳහා බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් හෝ නිකුත් කරනු නොලැබිය යුතු ය.

ඉදිකිරීම් සීමා තුළ භූමත හෝ භූගත ඉදිකිරීම් නොකළ යුතු බව.

48. (1) මෙම ප්‍රඥප්තියේ 21 වන වගන්තිය යටතේ ප්‍රකාශිත ඉදිකිරීම් සීමාවන් ඇතුළත යම් ගොඩනැගිල්ලක ප්‍රවේශ දොරකඩක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් සිදුකිරීම හෝ ඒවාට යම් එකතු කිරීමක් හෝ නැවත ඉදිකිරීමක් සිදුකිරීම, ස්මාරකයක්, පිළිමයක් හෝ එවැනි යමක් ඉදිකිරීම, නැතහොත් පොළවට යට තට්ටුවක් හෝ වෙනත් භූගත ඉදිකිරීමක් කිරීම හෝ යම් ළිඳක්, භූගත පොකුණක්, පතල් ළිඳක් හෑරීම, යම් බට එළීමක් සිදුකිරීම නොකළ යුතු ය.

(2) යම්කිසි මාර්ගයක ඉදිකිරීම් සීමාවෙන් ඔබ්බෙහි මායිම් වැටක්, තාප්පයක් ඉදිකිරීම, යම් ඉදිකිරීමක් සඳහා බාධාවක් නොවිය යුතු ය.

(3) මාර්ගයේ පළල, වාහන ගමනාගමනය සඳහා දෘෂ්‍යාමය පැහැදිළි බව, ඉඩ ප්‍රමාණය, මාර්ගය යථා පරිදි පවත්වාගෙන යාම සැලකිල්ලට ගෙන අනුමත සැලැස්මක නිශ්චිතව දක්වා ඇති මාර්ග ප්‍රමාණය

නොඉක්ම විය යුතුය යන කොන්දේසිය හා වෙනත් සුදුසු කොන්දේසි මත, උපදේශක මණ්ඩලයේ නිර්දේශය ඇතිව පමණක් ඉතා සුවිශේෂී අවස්ථාවක දී මාර්ග රක්ෂිතය තුළ යම් ආගමික වැදගත්කමක් ඇති ඉදිකිරීමක් කිරීමට පළාත් අධ්‍යක්ෂවරයා විසින් අවසර දිය හැකි ය.

49. පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත, රජයේ *ගැසට් පත්‍රයේ* IV වන කොටසේ (පළාත් සභා) පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් යම් මාර්ගයක හෝ මාර්ගයක කොටසක් සම්බන්ධයෙන් වූ ඉදිකිරීම් සීමා සංශෝධනය කිරීම හෝ පුළුල් කිරීම හෝ කරනු ලැබිය හැකි ය. — ඉදිකිරීම් සීමා සංශෝධනය කිරීම හෝ පුළුල් කිරීම.

50. (1) මෙම ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ඉදිකිරීමක් කරයි නම් හෝ යම් පවත්නා ඉදිකිරීමකට අළුතින් එකතු කිරීමක් කරයි නම්, විධායක ඉංජිනේරුවරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් එම නිවේදනය සිදුකරන දින සිට දින හතකට අඩු නොවන නිශ්චිතව සඳහන් යම් දිනකට හෝ ඊට පෙර එකී ඉදිකිරීම හෝ එම අළුතින් එකතු කිරීම කඩා බිඳ දමන ලෙස හෝ ඉවත් කරන ලෙස එම තැනැත්තාට හෝ ආයතනයට නියම කරනු ලැබිය යුතු ය. — අනවශ්‍ය ඉදිකිරීම් ඉවත් කිරීම.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් නිවේදනයක් නිකුත් කරනු ලැබ ඇතිවිට, නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් ඇතුළත දී හෝ එකී කාර්යය සඳහා තමා විසින් ඉල්ලා සිටීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත එකී නිවේදනයේ නියමයන්ට එකඟව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ හෝ ආයතනයේ වගකීම විය යුතු ය.

(3) *(අ)* ඉහත (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයක පරිදි ක්‍රියාකර නොමැති අවස්ථාවක දී, එකී ඉදිකිරීම කඩා බිඳ දමා හෝ ඉවත් කිරීමට සැලැස්වීම සඳහා තමාට බලය ලබාදෙන්නා වූ විධානාත්මක ආඥාවක් ලබාගැනීම සඳහා සහ ඒ වෙනුවෙන් වැයවන මුදල අයකර ගැනීම සඳහා පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

*(ආ)* මහේස්ත්‍රාත්වරයා විසින් පවත්නා කරුණු අනුව තමා සෑහීමකට පත්වන්නේ නම්, ඉහත (1) වන උප වගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද නිවේදනයේ වූ නියමයන්ට එකඟව ක්‍රියා කිරීම පැහැර හැර ඇති තැනැත්තා හෝ ආයතනය වෙත ද නිවේදනයක් නිකුත්කර පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි, එකී ඉදිකිරීම කඩා බිඳ දැමීමට හෝ ඉවත් කරන ලෙසට ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

*(ඇ)* එකී ඉදිකිරීම කඩා බිඳ දැමීමට හෝ ඉවත් කිරීමට එකී තැනැත්තා හෝ ආයතනය විසින් භාරගනු ලබන්නේ නම් මහෙස්ත්‍රාත්වරයා විසින් යෝග්‍ය යයි සලකනු ලබන යම් සාධාරණ කාලයක් හෝ දින තිහකට වැඩි නොවන කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) *(අ)* යම් ආගමික වැදගත්කමක් ඇති ඉදිකිරීමක් කඩා බිඳ දැමීම හෝ සුරක්ෂිත ලෙස ඉවත් කිරීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ඉදිකිරීම ඉවත් කිරීමට වගකිව යුතු සංවිධානයකට හෝ ආයතනයකට භාරදිය හැකි ය.

*(ආ)* යම් ආගමික වැදගත්කමක් ඇති ඉදිකිරීමක් ඉහත (අ) ජේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉවත් කිරීමට ඒ සඳහා බලය දෙන ලද ආයතනයට හෝ සංවිධානයට අපහසුවන අවස්ථාවක දී අධිකරණ නියෝගය අනුව නිසි ගෞරවය සහ සැලකිල්ල සහිතව එකී ඉදිකිරීම පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) ඉහත (3) වන උප වගන්තිය යටතේ විධානාත්මක ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා වෙත අවශ්‍ය සියළු සහාය පොලිසිය විසින් ලබාදිය යුතු ය.

(6) ඉහත (3) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද නියෝගයක් අනුව ක්‍රියා කිරීමේ දී යම් ඉදිකිරීමක් කඩාබිඳ දැමීමට හෝ ඉවත් කිරීමට පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද යම් සාධාරණ වියදමක් අයකර ගැනීම සඳහා පළාත් අධ්‍යක්ෂවරයා හෝ විධායක ඉංජිනේරුවරයාට හිමිකම තිබිය යුතු ය.

**ඉදිකිරීම් ඉවත් කිරීම් සම්බන්ධයෙන් වන්දි ගෙවීම.**

51. ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටි නීත්‍යානුකූල සම්පූර්ණ ඉදිකිරීමක් හෝ ඉදිකිරීමකින් කොටසක් හෝ ඉවත් කිරීම වෙනුවෙන් 29 වන වගන්තියේ සඳහන් වන්දි කමිටුව විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක්, හිමිකම් ඇති තැනැත්තාට ගෙවිය හැකි ය.

**මාර්ග අවහිරතා ඉවත් කිරීම.**

52. (1) යම් තැනැත්තකු විසින් ;

*(අ)* යම් මාර්ගයක් අවහිර කර ඇති හෝ බලෙන් අල්ලාගෙන ඇති බවට, හෝ

*(ආ)* යම් මාර්ගයක, මායිම් රේඛාව හෝ මායිම් කණු හෝ ඉදිකිරීම් සීමාව හෝ නිසි බලයකින් තොරව වෙනස් කර ඇති බවට, හෝ

*(ඇ)* යම් මාර්ගයක, නිසි බලයකින් තොරව මාර්ග බාධක පමුණුවා ඇති බවට,

විධායක ඉංජිනේරුවරයාට පෙනී යන්නේ නම්, තමා විසින් නිවේදනයක නිශ්චිතවම සඳහන් කාලයක් ඇතුළත වහාම එකී අවහිරතාවය, බලෙන් ඇල්ලීම, බාධකය, වෙනස් කිරීම ඉවත් කරන ලෙස එකී තැනැත්තා වෙත ලිඛිත නිවේදනයක් මඟින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) එකී නිවේදනය පරිදි අවහිරය, බලෙන් අල්ලා ගැනීම, බාධකය හෝ වෙනස් කිරීම ඉවත් කිරීමට ක්‍රියාකර යථා තත්ත්වයට පත් කර නොමැති නම්, විධායක ඉංජිනේරුවරයා විසින් එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය. එසේ කිරීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද යම් වියදමක් වේ නම් එකී වියදම වරදකළ තැනැත්තාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) ඉහත (2) වන උප වගන්තියෙහි සඳහන් ගෙවීම පැහැර හරින ඕනෑම තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකට වරදකරු වූ කල්හි රුපියල් පනස්දහස නොඉක්මවන දඩයකට හෝ මාස 6 ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට සහ විධායක ඉංජිනේරුවරයා විසින් හානිය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වටිනාකම ගෙවීමට යටත් කළ යුතු වන්නේය.

(4) ඉහත (2) වන උප වගන්තිය යටතේ ක්‍රියා කිරීමේදී ඊට එරෙහි යම් බාධා කිරීමක් හෝ විරෝධය පෑමක් හේතුවෙන් විධායක ඉංජිනේරුවරයාට එම මාර්ගය හෝ ඉදිකිරීම් සීමාව යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි බව පෙනී යන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි එකී බාධකය, බලෙන් අල්ලා ගැනීම, අවහිරය හෝ වෙනස් කිරීම පිස්කල්වරයෙකු මඟින් ඉවත් කිරීමට, පැහැදිලි කිරීමට හෝ යථා තත්ත්වයට පත් කිරීමට විධාන කරන අධිකරණ ආඥාවක් සඳහා ඉල්ලීමක් එම ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින් පිස්කල්වරයා වෙත ඉහත (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඔහු විසින් වහාම එකී ආඥාව ක්‍රියාවේ යෙදවිය යුතු අතර, එකී ආඥාව ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද සමඟ එකී කාරණය අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

**මැනීම, බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.**

53. පළාත් අධ්‍යක්ෂවරයා යටතේ කරන ලද යම් සැලසුමක් හෝ මැනීමක් සාක්ෂියක් වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එහි සඳහන් කරුණු පිළිබඳව බැලූ බැල්මට පෙනෙන ඔප්පු කිරීමක් ලෙස සැලකිය යුතු ය.

**මාර්ගයක් භාවිතා කිරීමේ අයිතිය ආරක්ෂා කිරීම.**

54. මාර්ගයක් බාධාවකින් හෝ අපහසුතාවයකින් තොරව භාවිතා කිරීම සඳහා මහජනතාවට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සලසා දීම සහ එකී අයිතිය ආරක්ෂා කරලීම ද, මාර්ගයක් තාවකාලිකව හෝ ස්ථිරව වසා දැමීම හෝ ඊට අවහිරයක් වීම හැකිතාක් දුරට වළක්වාලීම ද, දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය.

**මාර්ගයට අලාභහානි කිරීම, පින්තාරු කිරීම, ආදිය වරදක් බව.**

55. (1) නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව ;

*(අ)* රථ වාහන ගමන් කරන කොටසකින් සමන්විත මාර්ගයක කිසියම් කොටසක කාණුවක් කණින හෝ වෙනත් යම් කැණීමක් සිදුකරන ; හෝ

*(ආ)* විධායක ඉංජිනේරුවරයාගේ අවසරයකින් තොරව, මාර්ගයක කිසියම් කොටසකින් පස් හෝ තණ පිඩලි ඉවත් කරන ; හෝ

*(ඇ)* මාර්ගයක අලාභ හානි සිදුකරමින් ඒ මත ගිනි අවුලන හෝ ඊට යම් ද්‍රව්‍යයක් හලනු ලබන ; හෝ

*(ඈ)* වාහනයක ඉවතට විහිදී ඇති කොටසකින් වාහන ගමන් කරන කොටසට අලාභ හානි සිදුවන ආකාරයෙන් වාහනයක් ධාවනය කරන ; හෝ

*(ඉ)* මාර්ගයක් මත හෝ ඊට ඉහළින් සවිකර ඇති මාර්ග සංඥාවක් හෝ සළකුණක් හෝ එලෙස සවිකර ඇති කිලෝමීටර් කණුවක් හෝ පහන් කණුවක් හෝ දිශාව පෙන්වීමේ සළකුණක් හෝ එවැනි යම් උපකරණයක් හෝ සංඥා පහනක් හෝ නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව විකෘති කරන, කඩා දමන, අලාභහානි කරන හෝ වෙනස් කරන ; හෝ

*(ඊ)* මාර්ගයක කිසියම් මාර්ග භාණ්ඩයක් මත, පින්තූරයක්, අකුරක්, පිළිමයක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් සළකුණක් අලවන හෝ පින්තාරු කරන හෝ කැටයම් කරන හෝ සෑම තැනැත්තෙකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමු වරද සම්බන්ධයෙන් වන විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට ද, දෙවන හෝ තදනන්තර වරදකට වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට ද, වරද කිරීමෙන් පසුව වුව ද වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද දෙවන හෝ තදනන්තර වරදකදී මාස හය නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු ය.

(2) මාර්ගයක යම් පින්තූරයක්, අකුරක්, සංඥාවක්, පිළිමයක්, දැන්වීමක් හෝ වෙනයම් සළකුණක් හෝ එවැනි බාධාවක් ආදිය විධායක ඉංජිනේරුවරයා විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

56. (1) "C" හා "D" පන්තියේ මාර්ගයක් මත හෝ මාර්ගයක කොටසක් මත හෝ පාලමක් මත ගෙන යා හැකි ද්‍රව්‍ය හෝ මිනිසුන්, සතුන් හා ද්‍රව්‍ය ඇතුළුව පටවන ලද සම්පූර්ණ බර සමග වාහනයේ බර මෙට්‍රික් ටොන් දහයකට වැඩි නොවිය යුතු ය. අවශ්‍යතාවය පරිදි වාහන සම්බන්ධයෙන් වන උපරිම බර සීමාවන් හා පරිමාව, එනම් වාහනයේ දිග, පළල හා උස අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග මඟින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

මාර්ගයක හෝ පාලමක් මත ගෙන යා හැකි බර සීමා කිරීම.

(2) ඉහත (1) වන උප වගන්තියේ බර සීමාවන් හෝ වාහනයේ දිග, පළල හා උස සීමාවන් උල්ලංඝණය කරන වාහන අත් අඩංගුවට ගෙන මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අනුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල විධායක ඉංජිනේරුවරයා හෝ පළාත් අධ්‍යක්ෂවරයා විසින් එම මාර්ගය අයත්වන පොලිස් බල ප්‍රදේශයේ ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු ය.

(3) ඉහත (1) උප වගන්තිය යටතේ වරදක් කරන ඕනෑම තැනැත්තකු පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගනු ලැබිය හැකි ය.

(4) ඉහත (1) උප වගන්තිය යටතේ උපරිම බර හා පරිමාව පිළිබඳ සීමාවන් උල්ලංඝනය කරනු ලබන ඕනෑම තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී, විධායක ඉංජිනේරුවරයා විසින් හානිය යථාවත් කිරීම සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වටිනාකම සහ රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද, දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් ලක්ෂය නොඉක්මවන දඩයකට හෝ එක් වසරක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

57. (1) කිසියම් මාර්ගයක මාර්ග පථයට, පදික මාර්ගයට, රක්ෂිතයට හෝ මාර්ග නිර්මිතයකට ;

කැණීම් ආදියෙන් මාර්ගයට, නිර්මිතවලට හා රක්ෂිතයට අලාභහානි වීම සහ බාධා කිරීම.

*(අ)* යාබද ඉඩමේ කැණීමකින් හෝ එහි අතුරු ඵලයක් වශයෙන් ; හෝ

*(ආ)* එකී මාර්ගයට වාහනයක් පැදවීම මඟින් සිදුවන ආපදාවක් හෝ අනතුරක් මඟින් ; හෝ

යම් අලාභයක් සිදු වුවහොත් විධායක ඉංජිනේරුවරයා විසින් වහාම එම අලාභ හානිය ඇස්තමේන්තු කර එහි වටිනාකම, ප්‍රශ්නයට අදාළ ඉඩමේ අයිතිකරුගෙන් හෝ හානිය සිදුකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාගෙන් අයකර ගත යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තියේ සඳහන් ගෙවීම පැහැර හරින ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට විධායක ඉංජිනේරුවරයා විසින් හානිය සඳහා පිළියෙල කල ඇස්තමේන්තුවේ වටිනාකම ගෙවීමට හා රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට හෝ මාස හයක බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ  යටත් විය යුතු ය.

(3) යම්කිසි මාර්ගයක පදිකයන් සඳහා වෙන් වූ කොටසේ වාහනයක් නතර කර තැබීමෙන් අවහිර කරන ලද්දේ නම්, එසේ නතර කිරීම සඳහා වගකිව යුතු තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී, රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද දෙවන  හෝ තදනන්තර වරදකදී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු ය.

මාර්ගයක් අවහිර කිරීම වරදක් බව.

58. (1) යම්කිසි මාර්ගයක වාහන ගමන් කිරීමට හෝ මාර්ගයේ  ගමනා ගමනයට  හිතාමතාම කිසියම් ආකාරයකින් අවහිර කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට යම් අලාභයක් දැරීමට සිදුවන්නේ නම් එසේ අවහිර කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු  වරදකරු කරනු ලැබීමේදී, රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට  හා දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන අලාභහානියේ ඇස්තමේන්තුගත වටිනාකම ගෙවීමට හෝ මාස 3 ක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ වරදක් කරනු ලබන ඕනෑම තැනැත්තකු පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

මාර්ගයක වැලි, ගල්, දුව, දර හෝ අතු ආදිය දැමීම වරදක් බව.

59. (1) නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව මාර්ගයක ඉදිකිරීම් සීමාව තුළ වැලි, ගල්, දැව, දර හෝ අතු හෝ අපද්‍රව්‍ය හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් දමනු ලබන හෝ ගබඩා කරන ඕනෑම තැනැත්තකු හෝ ආයතනයක් වරදකට වරදකරු විය යුතු ය.

(2) මාර්ගයක ඉදිකිරීම් සීමාව ඇතුළත දමා ඇති වැලි, ගල්, දැව හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් ඉවත් කරන ලෙස හෝ වෙනත් තැනකට දමන ලෙස එසේ දමා ඇති ද්‍රව්‍යයේ අයිතිකරුට හෝ ආයතනයට විධායක ඉංජිනේරුවරයා හෝ පොලිස් නිලධරයකු විසින් නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) ඉහත (2) වන උපවගන්තිය යටතේ ක්‍රියා කිරීම පැහැර හැරියහොත් එකී තැනැත්තා  වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද, දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් විසිදහස නොඉක්මවන දඩයකට ද, වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙ වන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද දෙවන හෝ තදනන්තර වරදකදී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු  ය.

(4) ඉහත (2) වන උප වගන්තියේ දක්වා ඇති නියමයන් අනුව ක්‍රියා කරමින් වැලි, ගල්, දැව හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් ඉවත් කිරීම අයිතිකරු විසින් පැහැර හරින ලද අවස්ථාවක, පොලිස් නිලධරයකුගේ සහාය ඇතිව ඒ ද්‍රව්‍ය මාර්ගයෙන්, පිටත පිහිටි සුදුසු ස්ථානයකට ඉවත් කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් කටයුතු සැලැස්වීම සහ ඉවත් කිරීමේ ඇස්තමේන්තුගත වියදම අයිතිකරුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

60. (1) නිත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව, මාර්ග බෙදුම් තීරුවක, මාර්ග උරහිසක හෝ පදික මාර්ගයක ගසක් හෝ පඳුරක් සිටුවන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, පන්දහස නොඉක්මවන දඩයකට ද, දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදක දී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය. මාර්ග රක්ෂිතයක් තුළ හෝ ඒ අසල ගස්, පඳුරු සිටුවීම සීමා කිරීම.

(2) විධායක ඉංජිනේරුවරයා විසින්, මාර්ගය අවහිර වන සේ එම ගස හෝ පඳුර සිටවූ තැනැත්තාට දින තුනක් ඇතුළත එය ඉවත් කරන ලෙස නියම කිරීම හෝ එය ඉවත් කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය.

61. (1) කිසියම් මාර්ගයක වටරවුමක් තුළ හෝ බෙදුම් තීරයක් තුළ හෝ මාර්ග උරහිසක් දිගේ හෝ ගස්, පඳුරු, තණකොළ සහ පැල රෝපණය කර නඩත්තු කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් යම් තැනැත්තකුට හෝ ආයතනයකට අවසර දෙනු ලැබිය හැකි ය. වාහන හා පදික ගමනාගමනය, ගමන් කරන වාහනවල ආරක්ෂාව සහ රියැදුරන්ට මාර්ගය දර්ශනය වීම සැලකිල්ලට ගනිමින් නියම කරනු ලබන උසකට පමණක් එම ගස්, පඳුරු සහ පැල රෝපණය කළ යුතු බවට වූ කොන්දේසියකට යටත්ව ඒ අවසරය දෙනු ලැබිය යුතු ය. ගස්, පඳුරු, තණකොළ, පැල රෝපණය කිරීමට අවසර දිය හැකි බව.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ අවසරලත් තැනැත්තාට හෝ ආයතනයට බිම සිට මීටර් 0.75 කට වැඩි නොවන උසකට නාම පුවරුවක් සිටුවීමට විධායක ඉංජිනේරුවරයා විසින් අවසර දිය හැක.

62. යම්කිසි මාර්ගයක රථ වාහන ගමන් කරන කොටස හෝ පදික මාර්ගය හෝ මාර්ග උරහිස මත හෝ රක්ෂිතයක් තුළ කුණු රොඩු හෝ යම් ද්‍රව්‍යයක් තබන හෝ මඩුවක්, බක්කියක් හෝ ආධාරකයක් සාදන හෝ නිවාසයකින්, ගොඩනැගිල්ලකින් හෝ ගෙවත්තකින් මාර්ගයට අපවිත්‍ර ජලය හෝ සත්ත්ව අපද්‍රව්‍ය හෝ වෙනත් යම් ද්‍රව අපද්‍රව්‍යයන් හෝ තෙල් හෝ එවැනි ද්‍රව්‍යයක් එවන, හලන යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය. මාර්ගයක ද්‍රව්‍ය දැමීම හෝ තැබීම වරදක් බව.

63. කිසිදු තැනැත්තකු විසින් විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව අවසරය ලබා නොගෙන මාර්ගයක් හරහා ගේට්ටුවක් හෝ බාධකයක් ඉදි නොකළ යුතු ය. එසේ ගේට්ටුවක් හෝ බාධකයක් ඉදිකරන යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය. මාර්ගයක් හරහා බාධක යනාදිය ඉදිකිරීම.

64. කිසියම් මාර්ගයකට යාබද අයිතිකරු හෝ පදිංචිකරු වෙත මාර්ගයට හානියක් හෝ අවහිරයක් වන ලෙස හෝ ජලය බැසයාම අවහිර වන ලෙස හෝ ගලිය හිරවන ලෙස පස් හෝ කුණු රොඩු සේදී ඒම, එකතු වීම වැළක්වීම පිණිස දින දාහතරක් තුල අවශ්‍ය වන්නා වූ කාර්යයන් කරන ලෙස ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය. එවැනි දැන්වීමක් අනුව එකී නියමිත කාලසීමාව තුළ එසේ ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය. මාර්ගයකට පස් සේදී ඒම වැළැක්වීම.

65. කිසියම් මාර්ගයක ගමන් කරන වාහනවල සහ පදිකයන්ගේ ආරක්ෂාවට බාධා කිරීමක් සිදු කරන සහ ගොඩනැගිල්ලක් තනා ඇති හෝ තබා ඇති යම් නීතිවිරෝධී ආරුක්කුවක්, නෙරාගිය වහලක් හෝ ජනේලයක්, පඩිපෙලක්, තාප්පයක් හෝ ගේට්ටුවක්, නාම පුවරුවක් හෝ එවැනි යම් දෙයක් ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් යම් ගොඩනැගිල්ලක අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය. එවැනි දැන්වීමක් අනුව, සාධාරණ කාලයක් තුළ ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය. මාර්ගයක ගමන් කරන වාහන හා පදිකයින්ගේ ආරක්ෂාවට ඇති බාධක ඉවත් කිරීමේ බලය.

66. (1) මෙම ප්‍රඥප්තියේ 62 හෝ 63 හෝ 64 හෝ 65 යන වගන්තිවල විධිවිධාන යටතේ වරදක් සිදුකර ඇති අවස්ථාවක, එකී වරද සිදුකිරීම නැවැත්වීම හෝ නතර කිරීම පිණිස ඔහු විසින් වහාම පියවර ගතයුතු බවට එකී වරද සිදුකරන තැනැත්තාට විධායක ඉංජිනේරුවරයා විසින් ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය. වරදක් සම්බන්ධයෙන් විධායක ඉංජිනේරුවරයා විසින් ක්‍රියා කළ යුතු බව.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබුවේ කවර තැනැත්තකු වෙත ද, එකී තැනැත්තා එහි ඇතුළත් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, මහෙස්ත්‍රාත්වරයකු විසින්

පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද, දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පනස්දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදක දී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ 62, 63, 64 සහ 65 දක්වා වන වගන්ති යටතේ වරද දිගටම සිදුකරනු ලබන අවස්ථාවක දී, වරද පිළිබඳ විෂය වන ඉදිකිරීම හෝ දෙය කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස විධායක ඉංජිනේරුවරයාට බලය දෙමින් මහෙස්ත්‍රාත්වරයා විසින් විධානාත්මක ආඥාවක් නිකුත්කළ හැකි ය. විධායක ඉංජිනේරුවරයා විසින් පොලිස් නිලධාරියෙකුගේ සහාය ඇතිව එකී ඉදිකිරීම හෝ දෙය ඉවත් කරනු ලැබිය යුතු අතර, එකී ඉවත් කිරීම වෙනුවෙන් දරන ලද වියදම මහෙස්ත්‍රාත්වරයාගේ නියෝගය අනුව වරදකරුගෙන් අයකර ගත යුතු ය.

මාර්ගයක් දෙසට දෙරවල් හෝ ගේට්ටුවක් විවෘතව නොතැබිය යුතු බව.

67. (1) අතිවිශේෂ අවස්ථානුගත කරුණක දී පළාත් මාර්ග අධ්‍යක්ෂවරයාගේ එකඟතාවය මත විධායක ඉංජිනේරුවරයා විසින් දෙනු ලබන ලිඛිත අවසරය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් මාර්ගයක් වෙතට විවෘත වන ලෙස කිසිම පරිශ්‍රයක යම් දොරක් හෝ ගේට්ටුවක් සවි කරනු නොලැබිය යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් දොරක් හෝ ගේට්ටුවක් සවිකරනු ලැබූ අවස්ථාවක දී, විධායක ඉංජිනේරුවරයා විසින් එහි පදිංචිකරු වෙත කරනු ලබන දැන්වීමක් මඟින් එකී දොර හෝ ගේට්ටුව මාර්ගය දෙසට විවෘත නොවන ආකාරයට වෙනස් කරන ලෙස එකී පදිංචිකරු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(3) ඉහත (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, එම දැන්වීම භාරදෙන ලද දිනයේ සිට දින දාහතරක් ඇතුළත එකී දැන්වීමේ නියමයන්ට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, එකී තැනැත්තා වරදකට වරදකරු විය යුතු ය. මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස 3 ක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු අතර, එම දොර හෝ ගේට්ටුව ඉහත (2) වන උපවගන්තියේ සඳහන් ආකාරයට වෙනස් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් නියෝග කළ හැකි ය.

මාර්ගයට හැරී ඇති ගස් කැපීම සහ බිඳ හෙළීම ආදිය.

68. (1) කිසියම් මාර්ගයක වාහන ධාවනයට හෝ එහි ගමන් කරන්නන්ට අවහිර හෝ අන්තරාදායක වන ආකාරයෙන් *නැතහොත්* වාහන රියැදුරන්ට හෝ දෘෂ්ඨියට හෝ පොදු විදුලි පහනකින් නිකුත් වන ආලෝකයට අවහිරයක් සිදුවන ආකාරයෙන් යම් ගසක්, පඳුරක්, බඩවැටියක්, මාර්ගයක් ඉදිරියට නැමී ඇති අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් එකී අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් භාරදීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි දින හතක් ඇතුළත ඒවා පැහීම හෝ කපා දැමීම කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තියෙන් නියම කරන ලද කාලසීමාව ඇතුළත දැන්වීමේ වූ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැරියහොත්, එකී දැන්වීම මගින් නියම කරනු ලැබූ කාර්යයන් විධායක ඉංජිනේරුවරයා විසින් කරනු ලැබිය හැකි අතර එසේ කිරීම වෙනුවෙන් ඔහු දරන ලද සාධාරණ වියදම් එකී තැනැත්තාගෙන් අයකරනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) වන උපවගන්තියෙහි සඳහන් අයිතිකරු හෝ පදිංචිකරු එම බාධකය නිසි පරිදි ඉවත් නොකරන්නේ නම් එය වරදක් වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, පළමු වරට වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් වන විට රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද සෑම දෙවන හා තදනන්තර වරදක් සඳහාම රුපියල් විසිදහස නොඉක්මවන දඩයකට ද, වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට හා විධායක ඉංජිනේරුවරයා විසින් එම බාධකය ඉවත් කිරීම සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වටිනාකම ද ගෙවීමට යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදකදී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු ය.

මාර්ගයක සතුන්ට අයාලේ යාමට ඉඩ හැරීම වරදක් බව.

69. (1) යම්කිසි මාර්ගයක හෝ එහි රක්ෂිතයක් මත හෝ ඇතුළත කවර හෝ වේලාවක අයාලේ යන හෝ ගැවසෙන යම් සතකු සොයාගනු ලැබුවහොත්, එම සතුන් බලා ගන්නා හෝ සතුන්ගේ අයිතිකරු නැතහොත් එම දෙදෙනාම හෝ වරදකට වරදකරු විය යුතු ය.

(2) විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද අයාලේ යන සතුන් අල්ලන තැනැත්තා විසින් අයාලේ යන හෝ ගැවසෙන සතුන් අල්ලා තහනමට ගත යුතු අතර, එකී සතුන් අල්ලන තැනැත්තාට අයිති හෝ එකී තැනැත්තා විසින් කුලියට ගන්නා ලද, විධායක ඉංජිනේරුවරයා විසින් අනුමත කරන ලද පරිශ්‍රයක එම සතුන් ගැට ගසා තැබිය යුතු ය. එම සතුන් අල්ලන තැනැත්තා විධායක ඉංජිනේරුවරයා සමඟ ගිවිසුමකට එළඹ තිබිය යුතු අතර, එකී තැනැත්තා විසින් තහනමට අල්ලා ගත් සෑම සතකු පිළිබඳවම විධායක ඉංජිනේරුවරයා විසින් පොලිස් ස්ථානයකට සහ එම ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(3) සතුන් අයාලේ යාමට ඉඩ හැර මාර්ගය කිසියම් ආකාරයකින් අවහිර කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී, රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් විසිදහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් දිනක් සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට හා එම සතා බලා ගැනීමේ හා ආහාර සැපයීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද වියදම් අය කර ගැනීමට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද දෙවන හෝ තදනන්තර වරදකදී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු ය.

(4) විධායක ඉංජිනේරුවරයා විසින්, තහනමට ගන්නා ලද සතුන්ගේ ආරක්ෂාකාරී භාරකාරත්වය පිළිබඳව සහතික විය යුතු අතර, එම සතුන්ට ආහාර සැපයීම පිළිබඳව ද සහතික විය යුතු ය.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩය හා විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද වියදම් ගෙවා ඇත්නම් මිස අල්ලා ගන්නා ලද කිසිම සතකු අයිතිකරු වෙත ආපසු භාර නොදිය යුතු ය.

(6) දඩය පනවන ලද දින සිට දින හතක් ඇතුළත ඒ සතා සම්බන්ධයෙන් හිමිකම් පෑමට සහ එම දඩය ගෙවීමට කිසිදු තැනැත්තකු ඉදිරිපත් නොවුවහොත්, විධායක ඉංජිනේරුවරයා විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම නිත්‍යානුකූල වන අතර සතා තහනමට අල්ලා ගැනීම හා ආහාර සපයා දීම සම්බන්ධයෙන් දරන ලද වියදම් අයකර ගැනීම නිත්‍යානුකූල විය යුතු ය. සතා විකිණීමෙන් ලැබුණු මුදල පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

මාර්ගයකට යම් ද්‍රව්‍යයක්, ගිනිකෙළි භාණ්ඩයක් දැමීම හෝ විසි කිරීම වරදක් බව.

70. (1) නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව යම් තැනැත්තකු විසින් මාර්ගයක් වෙතට හෝ මාර්ග යක් මතට කවර ආකාරයකින් හෝ රථ වාහනයකට හානියක් හෝ මගියකුට හෝ මාර්ගය භාවිතා කරන්නකුට තුවාල වීමට හෝ අනතුරුදායක වීමට ඉඩ ඇත්තේ නම් ;

*(අ)* යම් දෙයක් විසි කරනු ලැබුවහොත් ; හෝ
*(ආ)* යම් ගින්නක් අවුලුවන හෝ ගිනිකෙළි භාණ්ඩයක් දල්වනු ලැබුවහොත් ; හෝ
*(ඇ)* යම් අපවිත්‍ර ද්‍රව්‍යයක්, කසල හෝ දුගඳ හමන ද්‍රව්‍යයක් දැමීමට හෝ ගලායාමට ඉඩ සැලසුවහොත්; හෝ
*(ඈ)* අනතුරු සිදුවන ආකාරයට කඹයක් හෝ යම් උපකරණයක එලනු ලබන හෝ එල්ලා තැබීමට සැලසුවහොත් ; හෝ

එකී තැනැත්තා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී , රුපියල් දසදහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් රුපියල් විසිදහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද දෙවන හෝ තදනන්තර වරදකදී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකටද යටත් විය යුතු ය.

මාර්ගයක් මත පලංචි ආදිය ඉදිකිරීමට අවසර ලබාගත යුතු බව.

71. (1) කිසියම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් හෝ ගොඩනැගිල්ලක් කඩාදැමීම, වෙනස් කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හෝ පවිත්‍ර කිරීම සඳහා කිසිදු තැනැත්තකු විසින් මාර්ගයකට ඉහළින් හෝ මාර්ගයට අවහිර විය හැකි පරිදි යම් පලංචියක් හෝ වෙනයම් ඉදිකිරීමක් කිරීම පිණිස විධායක ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් බලය දී ඇත්තේ නම් මිස සහ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි අනුව කරන්නේ නම් මිස ඉදිකිරීම හෝ රඳවා තැබීම නොකළ යුතු ය.

(2) විධායක ඉංජිනේරුවරයා විසින් ඉහත (1) වැනි උපවගන්තියේ සඳහන් කාර්යයන් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේ දී, ඉදිකිරීමට අදාළ විස්තර ලබා දීමට ඒ තැනැත්තා බැඳී සිටින අතර, මාර්ගයට අවහිරතාවයක් නොවන බවට විධායක ඉංජිනේරුවරයා සෑහීමකට පත්විය යුතු ය. බලපත්‍රයක් නිකුත් කිරීමේ දී,

*(අ)* අඳුර පවත්නා කාලය තුළදී ඉදිකිරීමට ප්‍රමාණවත් ලෙස ආලෝකය සැපයීම ;
*(ආ)* මාර්ගයට නැඹුරුව ඇති කොටසේ රතුපාට කොඩියක් ප්‍රදර්ශනය කිරීම ; සහ
*(ඇ)* කිසියම් වාහන ගමනාගමන පාලන උපකරණ ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ

කොන්දේසි ද පැනවිය යුතු ය.

(3) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු හෝ (2) වැනි උපවගන්තියේ කොන්දේසි අනුව ක්‍රියා කිරීම සාධාරණ කරුණක් නොමැතිව පැහැර හරින තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන හෝ මාස හයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදක දී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

මාර්ගයක් මත ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය ගොඩ ගැසීමට අවසර ගත යුතු බව.

72. (1) විධායක ඉංජිනේරුවරයාගේ ලිඛිත අවසරයක් ඇතිව මිස යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින්, මාර්ගයක් මත හෝ මාර්ග රක්ෂිතයක් මත ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් දේවල් තාවකාලික ගොඩගැසීම හෝ තාවකාලික කැනීම් කරනු නොලැබිය යුතු ය.

(2) එවැනි අවසරයක් ලබාදීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින්,

*(අ)* ගොඩනැගිලි ද්‍රව්‍ය තාවකාලිකව ගොඩගැසීමේ දී වාහන ගමනාගමන කොටසට අවහිරතාවයක් නොතැබීමටත් ;

*(ආ)* ද්‍රව්‍ය බෑමේ දී, පැටවීමේ දී හෝ මාර්ගයට හෝ මාර්ග රක්ෂිතයට හෝ මාර්ග උරහිසට හෝ කානු පද්ධතියට හෝ අලාභයක් සිදු නොවීමට ක්‍රියා කළ යුතු බව සහ එවැනි අලාභයක් සිදුවුවහොත් ඒ තැනැත්තා විසින්, විධායක ඉංජිනේරුවරයා වෙත අලාභය ගෙවිය යුතු බවටත් ;

*(ඇ)* විධායක ඉංජිනේරුවරයා විසින් සුදුසු යැයි කල්පනා කරන, විශේෂයෙන්ම උපයෝගිතා සේවාවලට අලාභහානි වැළැක්වීම හෝ ඒවායේ ප්‍රවේශය සහතික කරන බවටත්,

කොන්දේසි පැනවිය හැකි ය.

(3) එකී ගොඩගැසීම හෝ කැනීම සම්බන්ධයෙන් වූ වාහන ගමනාගමන සංඥා, ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විධායක ඉංජිනේරුවරයා විසින් දෙන ලද අවසරයේ සඳහන් විධානයන් අනුව ක්‍රියාකිරීම එවැනි ගොඩගැසීමක් හෝ කැනීමක් කරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් මාර්ගයක් මත යම් ගොඩනැගිලි ද්‍රව්‍යයක් තැබීමේ දී හෝ ඒ තුළ කැනීමක් කරන අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් ඉඩදෙනු ලබන කාලයට වඩා දීර්ඝ කාලයක් ඒ මාර්ගය තුළ එම අවහිරය හෝ කැනීම දිගටම පැවතීමට ඉඩ නොතැබිය යුතු අතර, ඔහු විසින්,

*(අ)* එකී බාධකය හෝ කැනීම නිසි ආකාරයෙන් ආවරණය කරනු ලැබිය යුතු අතර, අඳුර පවතින කාලය තුළ යථා පරිදි ආලෝකමත් කර තැබීමට කටයුතු සැලැස්විය යුතු ය ;

*(ආ)* විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලැබුවහොත් එකී බාධකය ඉවත් කිරීම හෝ කැනීම් වසා දැමීම කළ යුතු ය.

(5) *(අ)* ඉහත (1) වැනි උපවගන්තිය යටතේ අවසරය දෙනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද, සාධාරණ හේතුවක් හෝ අවසරයක් නොමැතිව ඒ කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින ; හෝ

*(ආ)* ඉහත (3) වැනි උපවගන්තිය යටතේ ඔහු වෙත පවරන ලද කාර්යය ඉටු කිරීම පැහැර හරින ; හෝ

*(ඇ)* ඉහත (4) වැනි උපවගන්තිය යටතේ ඔහු වෙත පනවන ලද නියමයන් ඉටු කිරීම පැහැර හරින ; හෝ

කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ කඩකිරීම හෝ පැහැර හැරීම සිදුකරන ලද අවස්ථාව සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත්විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදක දී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

73. (1) මාර්ගයක වැඩ ක්‍රියාත්මක කරවීම සඳහා වගකිව යුතු යම් තැනැත්තකු හෝ කොන්ත්‍රාත්කරුවකු විසින්, — මාර්ගයක වැඩ කරන විට ගතයුතු පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග.

*(අ)* එම වැඩ අවසන් වනතුරු ගමනාගමනයට සිදුවන අනතුරු වැළැක්වීම සඳහා, ගමනාගමනය විධිමත් කිරීම සඳහා සහ අනතුරු පිළිබඳව රථ වාහනවලට පූර්වාවාද කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලබන පරිදි වූ මාර්ග බාධක සහ මාර්ග සංඥා ඉදිකරනු ලැබිය යුතු අතර, වැඩ අවසන් වූ වහාම ඒවා ඉවත් කළ යුතු ය.

*(ආ)* එම වැඩ කරන ස්ථානය යථා පරිදි ආරක්ෂා සහිතව ආවරණය කර තැබීමට ද, අඳුර පවතින සම්පූර්ණ කාලය තුළ දී එම ස්ථානයට ආලෝකය සපයා තැබීමට ද කටයුතු සැලැස්විය යුතු ය.

(2) යම් තැනැත්තකු හෝ කොන්ත්‍රාත්කරුවකු විසින් ඉහත (1) වැනි උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇත්නම්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එකී පැහැර හැරීම අඛණ්ඩව සිදු කරනු ලැබූ එක් එක් දිනය සඳහා දිනකට රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය. දඩ මුදල නොගෙවන්නේ නම්, පළමු වරද සම්බන්ධයෙන් වන විට, එක් මාසයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද දෙවන හෝ තදනන්තර වරදක දී මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

(3) නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව, යම් තැනැත්තකු විසින්,

*(අ)* මාර්ගයක් භාවිතා කරන්නන්ට එහි වූ යම් බාධකයක් පිළිබඳව පූර්වාවාදයක් දීමේ කාර්යය සඳහා හෝ යම් අවහිරයක් ඇති විය හැකි අනතුරුවලින් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා හෝ ඉහත (1) වැනි උපවගන්තියට අනුව ඉදිකරන ලද හෝ තබන ලද යම් බාධකයක්, මාර්ග සංඥාවක් හෝ පහනක් කඩා දමන්නේ නම් හෝ ඒවායේ යම් වෙනසක් කරන්නේ නම් ; සහ හෝ

*(ආ)* එසේ තබා ඇති පහනක් නිවා දමන්නේ නම්, ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිදහස නොඉක්මවන දඩයකට හෝ තුන් මසකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට එකී තැනැත්තා යටත් විය යුතු ය.

74. (1) කිසියම් තැනැත්තකු හෝ රියැදුරකු විසින් හෝ මාර්ගය පළුදු වීමට හෝ හැරී යාමට ඉඩ ඇති උල් සහිත හෝ දැති සහිත හෝ දැති රෝද සවිකරන ලද වාහන ධාවනය කිරීම හෝ මාර්ගයක මතුපිට — මාර්ගයට හානි කරවන දැති

රෝද සහිත වාහන ධාවනය හෝ එබඳු යමක් ඇදගෙන යාම වරදක් බව.

සීරී යන, පළුදු වීමට ඉඩ ඇති හෝ හැරී යාමට ඉඩ ඇති ලෝහමය ද්‍රව්‍යයක් හෝ දැවමය ද්‍රව්‍යයක් ඇදගෙන යනු ලබන තැනැත්තා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) ඉහත (1) වැනි උපවගන්තිය පරිදි ක්‍රියා කිරීම හේතුවෙන් යම් මාර්ගයකට හානි සිදුවූ අවස්ථාවක එම හානිය යථාවත් කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් කටයුතු කළ යුතු අතර, ඒ සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවේ වටිනාකම එකී තැනැත්තාගෙන් අයකර ගැනීම නිත්‍යානුකූල විය යුතු ය.

ඉදිකිරීම් ආදිය පාලනය කිරීම.

75. (1) විධායක ඉංජිනේරුවරයාගේ අවසරයක් නොමැතිව, කිසිදු තැනැත්තකු හෝ ආයතනයක් විසින් මාර්ගයක් දිගේ හෝ හරහා හෝ යම් මාර්ග සංඥාවක් උඩින් යෙදූ බාල්ක, පයිප්ප, කේබල්, කම්බි, වයර්, මග දෙපස විහිදෙන අට්ටාල, දැන්වීම් පුවරු හෝ යකඩ පීලි නැතහොත් සමාන උපකරණ තැබීම හෝ සවිකිරීම නොකළ යුතු ය.

(2) කිසිදු තැනැත්තකු හෝ ආයතනයක් විසින් විධායක ඉංජිනේරුවරයාගේ අවසරයක් නොමැතිව මාර්ගයක් යටින් බිංගෙයක්, උමගක්, වලක් හෝ එවැනි වෙනත් යම් දෙයක් ඉදිකිරීම නොකළ යුතු ය.

(3) කිසිදු තැනැත්තකු හෝ ආයතනයක් විසින් විධායක ඉංජිනේරුවරයාගේ අවසරයක් නොමැතිව මාර්ගයක මධ්‍යයේ සිට මීටර් විස්සක් වූ දුරක් ඇතුළත මීටර් තුනකට වැඩි ගැඹුරකින් යම් කැනීමක් නොකළ යුතු ය.

(4) කිසිදු තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් විධායක ඉංජිනේරුවරයාගේ අවසරයක් නොමැතිව යම් පාලමක, සපත්තු පාලමක, බෝක්කුවක ඉදිකිරීමක අන්තිම කෙළවරේ සිට මීටර් පන්සියයක් ඇතුළත හෝ ඒ ආසන්නයේ වැලි ගොඩ දැමීම නොකළ යුතු ය.

(5) ඉහත (1) වැනි හෝ (2) වැනි උපවගන්තිවල සඳහන් කරුණු පිළිබඳව සිදුවිය හැකි හෝ සිදු වූ හානියක් සම්බන්ධයෙන් ආරක්ෂණ තැන්පතුවක් ලබා ගැනීමට හෝ ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරන අලාභය එසේ කරන තැනැත්තාගේ හෝ ආයතනයෙන් අයකර ගැනීමට විධායක ඉංජිනේරුවරයාට හැකි විය යුතු ය.

(6) ඉහත (1) වැනි, (2) වැනි, (3) වැනි හෝ (4) වැනි උපවගන්තිවල විධිවිධාන කඩකරන යම් තැනැත්තකු හෝ ආයතනයක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු ය.

මාර්ගයකට ප්‍රවේශ වීම සීමා කිරීම.

76. (1) විධායක ඉංජිනේරුවරයා විසින් දෙනු ලබන අවසරයක් මත හැර කිසිම තැනැත්තකු විසින් මාර්ගයකට ප්‍රවේශ වීම සඳහා ප්‍රවේශ මාර්ගයක් සම්බන්ධ නොකළ යුතු ය.

(2) එවැනි අවසරයක් දීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් -

*(අ)* ජලය බැසයාමේ අවහිරතාවයක් නොවන බවට ද ;

*(ආ)* කානුවට හෝ පැති බැම්මට හෝ මාර්ග උරහිසට හානියක් නොවන බවට ද ;

වගබලා ගත යුතු ය.

(3) ප්‍රවේශ මාර්ගය සම්බන්ධ කිරීමේ දී මාර්ගයට යම් හානියක් සිදුවුවහොත් එය අලුත්වැඩියා කිරීමට යන වියදම එකී හානිය සිදු කළ තැනැත්තාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(4) ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත

කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට යටත් විය යුතු ය. එම තැනැත්තා විසින් කරන ලද සම්බන්ධ කිරීම ඉවත් කිරීමෙන් එම මාර්ගය මුල් තත්ත්වයට පත් කිරීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරන ලද මුදල එකී තැනැත්තාගෙන් අයකිරීම නිත්‍යානුකූල විය යුතු ය.

77. (1) මෙම ප්‍රඥප්තියේ 34(4), 35(3), 46(4), 50(6), 52(3), 57(2), 59(4), 66(2), 66(3), 68(3), 69(3), 74, 75(6) සහ 76(4) උපවගන්තිවල සඳහන් වරදකට යම් තැනැත්තෙකු මහෙස්ත්‍රාත් අධිකරණයේ දී වැරදිකරු වූ විට සිදු කරන ලද හානිපූරණය සඳහා වැයවන මුදල් ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම සඳහා වූ නියෝගයක් අදාළ සිද්ධිය වූ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙතින් ලබා ගැනීමට විධායක ඉංජිනේරුවරයා කටයුතු කළ යුතු ය. හානිපූරණය සඳහා පොදු විධිවිධාන.

(2) ඉහත (1) වන උපවගන්තියෙහි සඳහන් පරිදි හානිපූරණය සඳහා වැය වූ හෝ වැයවන මුදල් ලබා ගැනීම සඳහා, නඩු පවරන අවස්ථාවේදීම, ගණනය කරන ලද මුදල් ප්‍රමාණය ඇතුළත් ඇස්තමේන්තුවක් හා පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් සහතික කරන ලද ප්‍රමාණවත් කරුණු අඩංගු වාර්තාවක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම විධායක ඉංජිනේරුවරයාගේ වගකීම විය යුතු ය.

(3) ඉහත (2) වන උපවගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ හෝ සහතිකයේ නිරවද්‍යතාවය හෝ වලංගුතාවය මේ වගන්තිය යටතේ ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වූ නඩු කටයුත්තක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ ගෙවන ලද හෝ අධිකරණ කටයුත්තකින් අයකරගන්නා ලද සෑම මුදලක්ම විධායක ඉංජිනේරු කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැරකර එම හානි යථාවත් කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට වැය කිරීම සඳහා අදාළ විධායක ඉංජිනේරුවරයා විසින් කටයුතු කළ යුතු ය.

## VII වන කොටස

### භාෂා පිළිබඳ විධිවිධාන සහ විශේෂ බලතල

78. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පුද්ගලයකු හෝ ආයතන වෙත භාරදිය යුතු සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවලින් විය යුතු ය. දැන්වීම්වල භාෂාව.

(2) යම් තැනැත්තකු වෙත යැවිය යුතු සෑම දැන්වීමක්ම ලියාපදිංචි තැපෑලෙන් හෝ එම තැනැත්තා වෙත පෞද්ගලිකව භාරදීම හෝ එම තැනැත්තාගේ නිවසේ සිටින සාමාජිකයෙකුට භාරදීම හෝ ඔහුගේ නිවසේ හෝ ඉඩමේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීම හෝ කරනු ලැබිය හැකි අතර, එකී කවර හෝ ආකාරයකට භාරදෙන ලද දැන්වීමක් එම තැනැත්තා වෙත පුද්ගලිකව සහ යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

79. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් මාර්ගයක හෝ මාර්ගයකට යාබදව යම් ඉදිකිරීමක්, අළුත්වැඩියාවක් හෝ යම් කටයුත්තක් කරගෙන යාම සඳහා බලපත්‍රය ප්‍රදානය කරන ඕනෑම පුද්ගලයකු, අධිකාරියක් හෝ ආයතනයක් විසින් එම බලපත්‍රය නිකුත් කිරීමට පෙර පළාත් අධ්‍යක්ෂවරයාගේ අවසරය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මාර්ගයක යම් කටයුත්තක් සඳහා පළාත් අධ්‍යක්ෂවරයාගේ අවසරය අත්‍යවශය බව.

80. තම බල ප්‍රදේශය ඇතුළත මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන යම් වරදක් වැළැක්වීමේ දී, ඊට ආධාර කිරීම සහ සහාය ලබාදීම සියලු පොලිස් නිලධරයන්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ, ග්‍රාම නිලධරයන්ගේ හෝ අදාළ වෙනත් නිලධාරීන්ගේ කාර්යය විය යුතු ය. යම් වරදක් වැළැක්වීමේ දී නිලධරයන්ගේ කාර්ය භාරය.

81. (1) මෙම ප්‍රඥප්තිය යටතේ නියම කර ඇති යම් කාරණයක් ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ හෝ කාර්යය සඳහා හෝ නියෝග සෑදීමට නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව.

(2) විශේෂයෙන්ම සහ ඉහත (1) වන උපවගන්තිය මඟින් අමාත්‍යවරයා වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

*(අ)* මාර්ගයක ධාරිතාවය සහ මාර්ග ස්වභාවය සැලකිල්ලට ගෙන වැලි, ගල්, පස් හෝ එවැනි ඛනිජ ද්‍රව්‍යයක් ප්‍රවාහනය කිරීම හේතුවෙන් මාර්ගයකට නිරන්තරයෙන් සිදුවිය හැකි හානිය, අළුත්වැඩියා කිරීම සඳහා දැරීමට සිදුවන වියදම ප්‍රතිපූර්ණය කිරීමට හැකිවන පරිදි එකී ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහනවලින් ගාස්තු අය කිරීම ;

*(ආ)* ප්‍රඥප්තියේ විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් දැනුම් දීමේ දී භාවිතා කරනු ලැබිය හැකි ආකෘති පත්‍ර ;

*(ඇ)* මාර්ගයක දෙපස තීරුවේ අනවශ්‍ය සංවර්ධන වළක්වාලීම ;

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම රජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) (පළාත් සභා) කොටසේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ සඳහා නියම කරනු ලැබිය හැකි පසු දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* IV (අ) (පළාත් සභා) කොටසේ පළකරනු ලැබිය යුතු ය.

අනනුකුලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන බව.

82. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල, භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

වයඹ පළාත් සභාවේ 2000 අංක 01 දරන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම.

83. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 01 දරන වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය පරිච්ඡින්න කරනු ලැබේ.

## VIII වන කොටස

### අර්ථ නිරූපණ

අර්ථ නිරූපන.

84. මෙම ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද ;

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද ;

"අමාත්‍යවරයා " යන්නෙන් තත්කාලයෙහි පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යවරයා ද ;

"ලේකම්වරයා " යන්නෙන් තත්කාලයෙහි වයඹ පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන් වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවද ;

"පළාත් අධ්‍යක්ෂවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද ;

"නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ - I හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ - II තනතුරු දරන නිලධාරියා හෝ නිලධාරිනිය ද ;

"මූලස්ථාන ඉංජිනේරුවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන ඉංජිනේරුවරයකු ද ;

"විධායක ඉංජිනේරුවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කොට්ඨාශයක ප්‍රධානියා ලෙස රාජකාරි කරන ඉංජිනේරුවරයකු ද ;
අදහස් වේ.

"මාර්ගය" යන්නෙන්

*(අ)* 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත යටතට හෝ වයඹ පළාතේ පිහිටි පළාත් පාලන ආයතනයක් යටතට නොගැනෙන මෙම ප්‍රඥප්තියේ III වන කොටසේ අර්ථ නිරූපනය කර ඇති, අමාත්‍යවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කළ හැකි සහ මෙම ප්‍රඥප්තියේ I වැනි උපලේඛනයේ සඳහන් සියලු මාර්ග හෝ පාරවල් ද ;

*(ආ)* මාර්ගයට ඉහළින් ඇති පාරවල් හෝ දෙපාර්තමේන්තුව සතු ඇඳීම් ද ;

*(ඇ)* බෝක්කු, පාලම්, සපත්තු පාලම්, අන්තර් හුවමාරු, කරත්ත පාරවල් සහ අඩි පාරවල්ද, ඒවාට අයත් සියලු පාලම්, බැම්, අගල් සහ කානු ද ;

*(ඈ)* මහජන සේවාවක් පවත්වා ගෙන යනු ලබන බෝට්ටු, පාරු, ඔරු ගමන් කරන ජල මාර්ග සහ තොටුපළවල් ද ;

*(ඉ)* මාර්ගයක ඉදිකිරීම් සීමාව තුළ පිහිටි රක්ෂිතය ද, එකී සීමාවට අයත් යාබද සහ පිටතින් පිහිටි සියලු ඉඩම් ද ;

*(ඊ)* යම් පාරක ආරක්ෂාව හෝ සුබසිද්ධිය උදෙසා වෙන් කර ඇති එම පාරට යාබද සියලු ඉඩම් ද;

*(උ)* යම් පාරක් තැනීම සඳහා ලකුණු කර ඇති හෝ වෙන් කර ඇති සියලු ඉඩම් සහ

*(ඌ)* මාර්ගවල සහ කරත්ත පාරවල මධ්‍යයේ සිට මීටර් දහයක් ඇතුලත පිහිටියා වූ ද, පෞද්ගලික දේපළක් නොවන්නා වූ ද, සියලු මුඩු බිම් සහ, ප්‍රසිද්ධ අඩි පාරවල මධ්‍යයේ සිට මීටර් තුනක් ඇතුලත පිහිටි සියලු මුඩු ඉඩම් ද,

දැක්වේ.

එම මුඩු ඉඩම් පෞද්ගලික දේපළක් බවට ඔප්පු කිරීමේ භාරය එය ප්‍රකාශ කරන තැනැත්තා සතු විය යුතු ය.

"රක්ෂිතය" යන්නෙන් මාර්ගයක ආරක්ෂාව, සුරක්ෂිත භාවය සහ එහි සුබ සිද්ධිය සඳහා සහ මාර්ගයක කානු හෝ අද්දරවලට යාබදව සහ පිටතින් පිහිටා ඇති සියලු ඉඩම් අදහස් වේ.

"මාර්ග අයිතිය" යන්නෙන් මාර්ගයක රථ වාහන ගමන් ගන්නා කොටස, මාර්ග උරහිස, අද්දර ඇති කානු සහ රක්ෂිතය අදහස් වේ.

"වැඩ " යන්නෙන් සියලු මාර්ග වැඩ අදහස් වන අතර, ඊට ;

*(අ)* යම් ව්‍යුහයක් ඉදිකිරීමට හෝ නිර්මාණය කිරීමට ආශ්‍රිත වැඩ,

*(ආ)* නිර්මාණයක් වෙනස් කිරීම හෝ අගලක් කැපීම,

*(ඇ)* පොළව කැනීම,

*(ඈ)* මාර්ගයක් සංවර්ධනය කිරීම, ඉදිකිරීම, පුනරුත්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම,

ඇතුළත් වේ.

"ගංගා" යන්නෙන් , ගංගාවක් හෝ වාන් හෝ ඇලක් හෝ දොළක් හෝ ජල මාර්ගයක් ද ;

"රජයේ නියෝජිත ආයතන" යන්නෙන් , රජයේ අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, රජයේ කාර්යාලයක්, සංස්ථාවක්, මණ්ඩලයක්, අධිකාරියක් ද ;

"පළාත් සභාවේ ආයතන" යන්නෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ ප්‍රඥප්තියක් යටතේ පිහිටුවා ඇති ආයතනයක්, කාර්යාලයක් ද ;

"පළාත් පාලන ආයතන " යන්නෙන්, වයඹ පළාතේ පිහිටි මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවක් ද ;

"සතුන් බලගන්නා තැනැත්තා" යන්නෙන්, යම් සතකුගේ සන්තකය දරන හෝ දරනු ලැබිය යුතු තැනැත්තා ද ;

"තැනැත්තා" යන්නෙන්, පුද්ගලයෙකු හෝ ආයතනයක් ද ;

"සාධාරණ කාලය" යන්නෙන්, අදාළ කාර්යය නිම කිරීමට ගතවන කාලය හෝ මාස 3 ක උපරිම කාලයක් ද ; අදහස් වේ.

### උපලේඛනය 1

### වයඹ පළාත් සභාවට අයත් මාර්ග

### කුරුණෑගල දිස්ත්‍රික්කය

